සියලු ම හිමිකම් ඇවිරිණි.
www.sinhalaguru.lk
විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල - විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල
විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල - විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල
විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල - විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල

**21 | S | I,II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II** | **පැය තුනයි.**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

අමතර කියවීම් කාලය තුළ ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සිංහල ගුරුතුමා YouTube Channel

සිංහල ගුරු

**උපදෙස් :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය

- ප්‍රශ්න අංක 01 සිට 03 දක්වා දී ඇති වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථයට වඩාත් සමීප වරණය තෝරන්න.

01. විදුහල්පතිතුමා රැස්වීමට පැමිණ **ආපයින් ම** ගියේ යැයි උප විදුහල්පතිතුමා පැවසී ය.
    (1) ප්‍රමාද වී (2) පැමිණි විගස ම (3) කල් ඇතිව (4) ආපසු හැරී

02. ජනතා මුදල් **යටිමඩි ගසා ගන්නා** බවට ඇතැම් පාලකයන්ට චෝදනා පවතී.
    (1) වංචනිකව තබාගන්නා බවට (2) උදුරා ගන්නා බවට
    (3) අපේක්ෂා කරන බවට (4) වියදම් කරන බවට

03. ඇතැම් ගුරුවරු ළමයින්ට **උල්පන්දම් දෙන** බවට විදුහල්පතිතුමා චෝදනා කළේ ය.
    (1) උපකාර කරන බවට (2) අත් උදව් කරන බවට
    (3) වැරදි දෙයට උදව් කරන බවට (4) උපහැරණ කියා දෙන බවට

- අංක 04 සිට 06 දක්වා දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

04. නවකතාවෙහි ජීවිතය පිළිබඳව අමුතු ..... ගැබ් වී ඇති බව බොහෝ විචාරකයන්ගේ මතයයි.
    (1) ප්‍රඥාවක් (2) දර්ශනයක් (3) හැඟීමක් (4) බලයක්

05. මාර්ටින් වික්‍රමසිංහ මහතා විවේචනය කළේ බුදු දහම නොව ඒ පිළිබඳව පැවති ..... මතයන් ය.
    (1) සාධාරණ (2) අවංක (3) සත්‍යවාදී (4) මිත්‍යා

06. ගැමි ජීවිතය පිළිබඳව .... ලද දැනුම සාහිත්‍ය නිර්මාණකරුවා සිය නිර්මාණවලට යොදා ගනී.
    (1) අහම්බෙන් (2) මොහොතින් (3) ප්‍රත්‍යක්ෂයෙන් (4) ආකාස්මිකව

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    (1) වයිරසය, ප්‍රකූර්ති, දූරස්ථ, වීර්‍යය
    (2) ව්‍යංග්‍යාර්ථ, විද්‍යමාන, ඓක්‍යය, ගැටලු
    (3) සාමාර්ථ්‍යය, රිද්මයානුකූල, ලේඛණය, කතෘ
    (4) නිෂ්පල, ප්‍රස්ථාරය, උළෙල, කැළණිය

08. **පිළිගැනීම**, **මුහුණුවර**, **අභෞතික**, **නිමැවුම** යන පදවල දෙවැනි අකුරෙහි ඇතුළත් පිල්ලම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ඇදපිල්ල, කෙටි ඇදය, ඉස්පිල්ල, ඇකාරය
(2) ඉස්පිල්ල, පාපිල්ල, ගයනුකිත්ත, කෙටි පාපිල්ල
(3) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, කෙටි ඇදය
(4) ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව, ගයනුකිත්ත, ඇලපිල්ල

09. **'මිතුරා'** යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ගය වනුයේ,

(1) ඕෂ්ඨජ, මූර්ධජ, කණ්ඨජ ය. (2) තාලුජ, දන්තජ, මූර්ධජ ය.
(3) මූර්ධජ, තාලුජ, දන්තජ ය. (4) ඕෂ්ඨජ, දන්තජ, මූර්ධජ ය.

10. **අකාරාදී පිළිවෙළට** පද ගැළපී ඇති වරණය සහිත පිළිතුර තෝරන්න.

(1) ලෝකෝපකාරය, සිරිත් මල්දම, බුදුගුණ අලංකාරය, සුභාෂිතය
(2) සද්ධර්මාලංකාරය, සිලෝසතකය, ධර්මප්‍රදීපිකාව, අමාවතුර
(3) ගුත්තිල කාව්‍යය, දම්පියා අටුවාව, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ
(4) අමාවතුර, පංචිකා ප්‍රදීපය, සිදත් සඟරාව, සද්ධර්මරත්නාවලිය

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) දෙවියකු, කුරුල්ලන්, කිවිඳියක, සිවලුන් (2) වඳුරෙක්, කුරුල්ලෙකු, නිළියක්, කවීහු
(3) ගායකයෝ, ළඳුන්, රජිනක, මිනිසුන් (4) ධනවතුන්, සෙබළෙක්, ගොවීහු, මිතුරන්

12. පැටවු කැදැල්ලෙහි සතුටින් ජීවත් වූහ. යන වාක්‍යයෙහි **'කැදැල්ලෙහි'** යන්නේ විභක්තිය වන්නේ,

(1) ආලපන (2) ආධාර (3) කරණ (4) අවධි

13. **'රන් ආභරණ'** යන්න අයත් වන්නේ,

(1) විභක්ති සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.
(3) අව්‍ය සමාසයට ය. (4) 'ද්'කාරාර්ථ සමාසයට ය.

14. නීති + ඉක යන ප්‍රකෘති හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

(1) නීතික (2) නීතියික (3) නෛතික (4) නේතික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) සමාස - වනමල්, පස්පියුම්, ප්‍රබල, කුරුලුගීත
(2) කෘදන්ත - වැටුණු, ලියවිණි, ලියුම්, බලන්නී
(3) මිශ්‍ර ක්‍රියා - බලමින්, ගයගයා, කියා දී, දුවමින්
(4) සන්ධි - වමත, මැදගිල්ල, දෑත, සුරඟන

16. **අසම්භාව්‍ය** ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) අම්මා බත් උයමින් දරුවන්ට කැව්වා ය.
(2) ළමයින් පාඩම් කළොත් හොඳ ප්‍රතිඵල ලැබේවි.
(3) නංගී අඬ අඬා පොත කියෙව්වා ය.
(4) ගුරුතුමා පොත පෙරළා පාඩම ඉගැන්නුවේ ය.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

17. මක්නිසාද යත් බස ඉතා **සූක්ෂම** ලෙස පරිහරණය කරන්නේ කවීන් ය.

(1) පරිස්සමෙන් (2) සංයමයෙන් (3) සියුම්ව (4) චතුර

18. සිදුවීම් **ස්මෘතියෙහි** ප්‍රතිනිර්මාණය වීම හා එම ස්මෘති සටහන් මගින් නව සංකල්ප බිහිවීම සිදුවේ.

(1) ස්වභාවය (2) සංග්‍රහය (3) දක්ෂ ලෙස (4) මතකයේ

19. කිසිඳු සාහිත්‍ය නිර්මාණයක් **ආකස්මිකව** පහළ වන්නක් නොවේ.

(1) හේතුවක් නැතිව (2) වැස්සක් මෙන්
(3) ඇසූ දුටු පමණින් (4) අනුමාන ලෙස

www.sinhalaguru.lk

20. දී ඇති වචන ගොනු අතරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවතින පද පේළිය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) පෑන, පැන්සල, රූල, මකනය (2) ඊතලය, දුන්න. කෙටේරිය, කියත
(3) කවරය, ලිපිය, මුද්දරය, මුද්‍රාව (4) හැන්ද, කෝප්පය, සීනි, තේකොළ

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවල සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නර - මිනිස් ගස - වෘක්ෂ වැස්ස - වැහි කන්ද - සෙල්
(2) රථය - රිය නිවස - ගෘහය හිරු - සිසි පාර - වීදිය
(3) කුරුල්ලා - සකුණ ජලය - අඹ කේශ - කෙස් වඳුරා - වානර
(4) රජ - නරවර හඳ - දිවාකර අග්නි - ගිනි කඩුව - කඟ

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පොළොව - බිම, භූමිය, මිහිය, දෙරණ (2) හඳ - චන්ද්‍රයා, හිමකර, නිශාකර, සඳු
(3) මුහුද - සයුර, සිඳු, සාගරය, රුවනාර (4) නෙළුම් මල - පියුම, තඹර, පංකජ, උපුල්

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) ආගමන - විගමන (2) උත්තම - අධම
(3) සම්මාන - අවමාන (4) කනිෂ්ඨ - කනිටු

24. වැරදි අදහසක් දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'ය' යෙදෙන අකුර හල් කොට ලියනු ලැබේ.
(2) ගැට ඇලපිල්ල 'ෟ' ස්වරය නියෝජනය කරන පිල්ලමයි.
(3) ආගම සන්ධියේ දී 'ව්' ආගමනය කළ හැකි ය.
(4) ආලපන විභක්තිය සමාස කාර්යයට යොදා නොගනී.

25. පහත දැක්වෙන වාක්‍යය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත **අර්ථාන්විත** වාක්‍යය තෝරන්න.

(1) කලා ශිල්ප හොඳ ඉගෙන ගැනීමට දරුවන්ගේ අදහසයි.
(2) කවි ලිවීමේ අත්දැකීම් වැදගත් නිසා කවියා අත්දැකීම් ලබයි.
(3) කලා වැව සාදන ලද්දේ ධාතුසේන රජතුමා විසින් යැයි ඉතිහාසඥයෝ පවසති.
(4) සිතුවම් සීගිරි අප්සරාවෝ ලොව මවිත කරන නිර්මාණ වේ.

- ප්‍රශ්න අංක **26** සිට **27** ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන **ප්‍රස්ථාව පිරුළ** අන්තර්ගත වරණය තෝරන්න.

26. ආරක්ෂාවට තිබූ දෙයක් විනාශ වී යාම.

(1) කබලෙන් ළිපට වැටුණා (2) වක්කඩේ හකුරු හැංගුවා වගේ
(3) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ (4) අත දී දත නියවීම

27. ගැටලු විසඳීමට නුසුදුසු මාවතක් තෝරා ගැනීම

(1) කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි. (2) නරියට කුකුළු කොටුව බාරදුන්නා වගෙයි.
(3) හිසේ රුදාවට කොට්ටේ මාරු කළා වගෙයි. (4) පරංගියා කෝට්ටේ ගියා වගේ

28. **ආගම** හා **ස්වරාදේශ** සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සහෝදරයෝ, පොල්ලත්ත (2) වියවුල, සර්වෝදය
(3) පෙස්සම, වක්කඩ (4) දකුණත, සූර්යෝදය

- ප්‍රශ්න අංක **29** සිට **30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍ය තෝරන්න.

29. (1) අම්මා රැජිනක් මෙන් සිනාසුණා ය.
(2) සංචාරක කුරුල්ලෝ ලංකාවට පැමිණ ඇත.
(3) මිනිස්සු පොත් කියවතියි ලේඛකයෝ සිතති.
(4) අප වෙනදාට වඩා විභාගයට වෙහෙස විය යුතු ය.

www.sinhalaguru.lk

30. (1) ගුරුවරු දෙවිවරු සේ ශිල්ප උගන්වති.
(2) වැද්දෝ ආදිවාසීහු වෙති.
(3) වෙඩික්කරුවෝ සතුන් මරන්නේ ඇයි ?
(4) මුවදෙන පැටවු සමග කැලයට ගියා ය.

31. - ළමයි අප ....... මේ පිළිබඳ කතා කළහ.
- දෙමාපියෝ දරුවන් .... වෙහෙස වී වැඩ කරති.
- ගුරුවරු දෙවියන් ---- වන්දනාවට ලක්විය යුතු ය.
- මේ පොත .... අපේ කැමැත්තක් ඇත.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා යෝග්‍ය **නිපාත පද** අනුපිළිවෙළ කුමක් ද?
(1) සමග, උදෙසා, මෙන්, ගැන (2) උදෙසා, මෙන්, සඳහා, ගැන
(3) ගැන, සඳහා, මෙන්, උදෙසා (4) සමග, මෙන්, ගැන, සඳහා

32. පහත දැක්වෙන වාක්‍ය **ලේඛන ව්‍යවහාරයට** හැරවූ විට වඩාත් ම නිවැරදි වන්නේ කුමක් ද?
'මං ළඟදිත් ඒ පොත කියෙව්වා'
(1) මා ළඟදිත් ඒ පොත කීවෙමි. (2) මම ළඟදීත් ඒ පොත කියවමි.
(3) මම ළඟකදී ඒ පොත කියවා බැලුවෙමි. (4) මම ළඟකදිත් ඒ පොත කියෙව්වෙමි.

33. '**හෙළදිව අතීත ප්‍රතිරාව**' නම් කෘතියේ පරිවර්තකයා වන්නේ,
(1) කුමාරතුංග මුනිදාස (2) අභය හේවාවසම්
(3) විමල් ජී. බලගල්ල (4) ජී. බී. සේනානායක

34. බෙදූ එම නීතිය
දිගු නොවූ කෙටි යුගය ඒ රට
ස්වර්ණමය යුගයක් ම වූ බව
දනන් තුඩ තුඩ තවත් පැවසෙයි
මේ පද්‍ය කොටස උපුටා ගන්නා ලද **නාට්‍ය නිර්මාණය** වන්නේ,
(1) මනමේ නාට්‍යය (2) සිංහබාහු නාට්‍යය
(3) හුණුවටය නාට්‍යය (4) තලමල පිපිලා නාට්‍යය

35. '**නවකතා කලාව**' හා '**සාහිත්‍ය විද්‍යාව**' යන කෘතිවල ලේඛකයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය වන්නේ,
(1) විමල් දිසානායක, එදිරිවීර සරච්චන්ද්‍ර (2) ගුණදාස අමරසේකර, දයාසේන ගුණසිංහ
(3) ජී. බී. සේනානායක, එදිරිවීර සරච්චන්ද්‍ර (4) සිරි ගුණසිංහ, මඩවල එස්. රත්නායක

36. වෙරළ ඉගිළ තුළ රළ වැළ ලෙස උලෙළ
නැබළ පටළ පෙළ ලෙළවමිනි කෙළ කෙළ
කරළ කෙරළ මොළ බළ දළ දප පහළ
පුවළ සිහළ දළ බළ මුළු නිති ඔසළ
ඉහත පද්‍යයෙහි 'ළ' කාරය යොදා ගැනීමෙන් මතුකර ඇති අලංකාරය,
(1) අර්ථාලංකාරයයි. (2) උපමාලංකාරයයි.
(3) අනුප්‍රාසාලංකාරයයි. (4) ස්වභාවෝක්ති අලංකාරයයි.

37. ගොඩ දිය අහසේ හැම තැන ඔබගේ නම කියවමු ලංකා
ඔබ වෙනුවෙන් එන වෙඩි සැර මල් පෙති සේ සලකමු ලංකා
මේ ගීත කොටසෙහි ඇතුළත් වන අලංකාරය වන්නේ,
(1) රූපකාලංකාරයයි. (2) උපමාලංකාරයයි.
(3) අනුප්‍රාසාලංකාරයයි. (4) ස්වභාවෝක්තියයි.

www.sinhalaguru.lk

38. **'ඉතින් චාර්ලිස්, උඹේ කතාන්තරය පටන් ගනිංකෝ... උඹට ලොකු දැවැද්දක් එක්ක හිරයක් ගෙනෙන්ට අනිත් අයවලුන් වීරිය කරද්දී උඹ මක් කළා ද?'**

මේ පාඨය උපුටා ගන්නා ලද සාහිත්‍ය කෘතිය වන්නේ,

(1) වාසනාවන්ත සහ කාලකණ්ණි පවුල් කෘතිය
(2) ජයතිස්ස සහ රොසලින් කෘතිය
(3) හෙයියම්මාරුව කෘතිය
(4) වඩබාගින්න කෘතිය

39. එමින් කිරුළු රදනට පොරණ නිලතු රු
කෙළෙන් පසඟ තුරු නද ලැබ ම තනතු රු
බියෙන් නොහැර කරනා විලස අද තු රු
පුහුන් කරති සත මෙහි පසඟ ගොස තු රු

මේ පද්‍ය ඇතුළත් වන්නේ,

(1) හංස සන්දේශයෙහි ය.
(2) නීල කොබෝ සන්දේශයේ ය.
(3) සැළලිහිණි සංදේශයේ ය.
(4) සැවුල් සංදේශයේ ය.

40. පහත සඳහන් වක්‍යයේ අදහසට වඩාත් **සමීප අදහස** දෙන වාක්‍යය තෝරන්න.

'මානවයාගේ තිබුණු ශක්‍යතා අතර එකක් තමයි භාෂා ශක්‍යතාව, සන්නිවේදන ශක්‍යතාව, ඒ කියන්නේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශබ්ද නිකුත් කිරීමේ හැකියාව'

(1) මිනිසාට ඇති එක ම හැකියාව මුවින් ශබ්ද නිකුත් කරමින් කතා කිරීමේ හැකියාවයි. එයින් අදහස් ප්‍රකාශ වේ.
(2) මිනිසාට ඇති හැකියාවන් අතරින් එකක් ලෙස භාෂාව හා අදහස් සන්නිවේදනය කිරීමට ශබ්ද නිකුත් කිරීමේ හැකියාව පවතී.
(3) මානවයාට බොහෝ හැකියා ඇත. ඒ අතරින් කතාකරමින් අදහස් දැක්වීමේ හැකියාව ඇත්තේ භාෂාවටයි.
(4) මිනිස්සු භාෂාව උපතින් ලැබූ හැකියාවකි. එයින් අන් අය සමග කතා කිරීමට හැකි ය. එය ද විශේෂ ශක්‍යතාවකි.

www.sinhalaguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි.
www.sinhalaguru.lk
විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල - විශ්වසනීය ප්‍රතිඵල අනන්තය... - සිංහල ගුරුතුමා - රසංජන කලුන්ගල්ල

21 S I,II

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)

## සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. **(i) සිට (x) තෙක් ඇති සියලු ම කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,
(අ) අන්තඃස්ථාක්ෂරයක් ලියන්න.
(ආ) වර්ගාන්තාක්ෂරයක් ලියන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය **සදොස් ය.** එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
'නිරර්ථක උත්සව තවදුරටත් අත්‍යාවශ්‍ය නොවන බව අමාත්‍යවරයා සිය ධූරයේ වැඩ අරඹමින් කියා සිටියේ ය.'

(iii) පහත සඳහන් පද **සන්ධි කර** සන්ධි වර්ගයේ නම ලියන්න.
(අ) ගැමි + ඕ
(ආ) මහ + උපකාර

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **කෘදන්ත** පද දෙකක් ලියන්න.
'මෙවර විභාගයට ලියන ළමයි සම්මන්ත්‍රණයට අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු බව නිවේදනය කෙරිණි.'

(v) පහත සඳහන් සමාස පද කවර **සමාස වර්ගයට** අයත් වේ දැයි ලියන්න.
(අ) දිගැසි
(ආ) රන්රිදී

(vi) පහත සඳහන් යෙදුම්වල පළමු වන වචනය සමග දෙවන වචනයෙන් නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය සකස් කරන්න.
(අ) මාතෘ බස
(ආ) පුවත් ශීර්ෂ පාඨ

(vii) පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද කවර **ක්‍රියා පද** වර්ගයකට අයත් වේ ද?
(අ) ළමයි පොත **පෙරළා** පාඩම කියවූහ.
(ආ) **බලවු** යොමා නෙත අපේ ම මාවත අපේ අතින් ගොඩ නැගෙන සැටි

(viii) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.
(අ) රජින **මාලිගාවෙන්** බැස ගියා ය.
(ආ) වෛද්‍යවරයා **රෝගීන් වෙනුවෙන්** නැගී සිටියේ ය.

(ix) පහත සඳහන් **කර්තෘකාරක** වාක්‍යය **කර්මකාරකයට** හරවා ලියන්න.
(අ) ගුරුවරු සිසුන් දැනුවත් කරති.
(ආ) වෛද්‍යවරයෙක් රෝගීන්ගේ සුවදුක් විමසුවේ ය.

(x) පහත සඳහන් වාක්‍යය **සදොස් ය.** ඒවා **නිදොස්** කර ලියන්න.
(අ) ශිෂ්‍යයෝ පාසල පිරිසිදු කරතියි ගුරුතුමා සිතුවේ ය.
(ආ) අපි අසල්වාසීන්ගේ මිතුරන් වෙමු.

(ලකුණු: 20)

**02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) මත් උවදුර රටින් තුරන් කිරීමට පෙළ ගැසෙමු. විෂ මත්ද්‍රව්‍ය සමස්ත ජන සමාජයේම බාල, තරුණ, වැඩිහිටි ජීවිත ආක්‍රමණය කර ඇත. රටේ ළමා පරපුර මතට ගොදුරුවීම, තරුණ පරම්පරාව මතට ලොල්වීම යනු රටක විනාශයයි. අධ්‍යාපන, සමාජ, ආර්ථික දේහයම එයින් විනාශ වී යයි. නීතිය, අධ්‍යාපනය, ආගම හා සමාජ ආයතන මේ තත්වයෙන් ගොඩඒමට උපකාර කළ යුතු ය. මතට ලොල්වූවන් එයින් මුදා ගැනීමට සියලු දෙනා පෙළ ගැසිය යුතු ය.

(ආ) අලි ඇතුන් රටට විදේශ විනිමය ගෙන දෙන වටිනා හා අගනා සම්පතකි. මෑත කාලයේ මෙරටට පැමිණි විශාල ප්‍රමාණයක් විදේශ සංචාරකයින්ගේ ආදරය හා අවධානය දිනාගත් අලි ඇතුන් දිනෙන් දින මිය යමින් පවතී. අලි මිනිස් ගැටුමේ ප්‍රතිඵලයක් ලෙසින් ද විදුලි රැහැන් ඇදීම, වෙඩි තැබීම හා වෙනත් විනාශකාරී ක්‍රම මගින් අලි ඇතුන් මරා දමති. දුම්රියේ හා වෙනත් රථවාහනවල ගැටීමෙන් ද දෛනිකව මිය යන අලි ඇතුන් ගණන විශාල ය. රජය, නීතිය පමණක් නොව මිනිසුන්ගේ තේරුම් ගැනීම ද අලි ඇතුන් රැක ගැනීමේ ක්‍රියාවට ඉතා වැදගත් ය.

(ඉ) දිනපතා සිදුවන මාර්ග තදබදය, අනතුරු, ඉන්ධන දහනය, කාලය නාස්තිකිරීම වැනි විනාශකාරී ක්‍රියාවන් බොහෝමයක් සිදුවන්නේ ශක්තිමත් හා සුවපහසු කාර්යක්ෂ පොදු ප්‍රවාහන සේවාවක් නොමැතිවීම හේතුවෙන් ය. රටක සංවර්ධනයේ පදනම වන්නේ ගුණාත්මක පොදු ප්‍රවාහන සේවයකි. මෙරට බොහෝ මිනිස්සු තමන්ගේ වටිනා කාලය පැය ගණනින් මහමග ගෙවා දමති. රාජ්‍ය හා පෞද්ගලික සේවාවන්හි ආකර්යක්ෂමතාවට ද හේතුවී ඇත්තේ පොදු ප්‍රවාහනයේ දුර්වලතාවයන් ය. රජයේ හා පෞද්ගලික අංශයේ සහයෝගයෙන් හෝ ඉතා උසස් පොදු ප්‍රවාහන සේවයක් ඇතිකළ යුතු ය.

(ඊ) රථවාහන වෙළෙඳපොළ දෙස බැලීමේ දී අපට පෙනී යන්නේ ඉන්ධන දහනය කරමින් ධාවනය වන රථවාහන වෙනුවට විදුලි බලයෙන් ධාවනය කෙරෙන නවීන පන්නයේ රථවාහන සීඝ්‍ර ලෙස වෙළෙඳපොළට පැමිණ ඇති අයුරු ය. එයින් පැහැදිලි වන්නේ පොසිල ඉන්ධන වෙනුවට විදුලි බලශක්තිය ඉදිරියට පැමිණ ඇති ආකාරයයි. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වැනි පාරිසරික ගැටලු රාශියකට මෙය හොඳ විසඳුමකි. ලොව ප්‍රධාන පෙළේ දියුණු රටවල් මේ වන විට පොදු ප්‍රවාහන මාධ්‍යයන් පවා විදුලි බලයට පරිවර්තනය කර ඇත.

(ලකුණු: 20)

**03. පහත දැක්වෙන ජේදය වචන 65-75 අතර වන සේ සාරංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරංශය අග ලියන්න.**

මානව වර්ගයාගේ විශිෂ්ටතම නිර්මාණය භාෂාවයි. මානව ශිෂ්ටාචාරයක් හා සංස්කෘතියක් ගොඩනගා ගැනීමට මිනිසාට හැකි වූයේ භාෂාව නිපදවා ගත් නිසා ය. මිනිසා මුලින් ම ඉගෙන ගත්තේ කතා කිරීමට ය. කතා කරන්නේ මුවින් නිකුත් කෙරෙන ශබ්දවලිනි. මුවෙහි පිහිටා ඇති උගුර, දිව, රහදිව, තල්ල, දත් හා තොල් යන අවයව මේ ශබ්ද නිකුත් කිරීමට යොදා ගැනේ.

ලෝකයේ කුමර රටක ජීවත් වුවත් කතා කිරීම පිණිස හැම දෙනා ම යොදා ගන්නේ මේ උච්චාරණ අවයව පද්ධතියයි. එසේ වුව ද ඔවුන්ගේ මුවින් නිකුත් වන්නේ එක ම ශබ්ද පද්ධතියක් නොවේ. ඒ ශබ්ද භාෂාවෙන් භාෂාවට වෙනස් වේ. අප්‍රිකාවේ 'කියුකු භාෂාව' කතා කරන්නන් නිකුත් කරන සමහර ශබ්ද ඔවුන්ට ම ආවේණික ශබ්ද වේ. දෙමළ බසේ සමහර ශබ්ද ද සිංහලයාට හුරු නැත.

සංස්කෘත භාෂාවේ යෙදෙන සමහර ශබ්ද පාලි භාෂාවෙහි නැත. 'ඍ' 'ඓ' 'ඖ' යන ස්වර ශබ්ද මෙනි. පාලි භාෂාවෙහි යෙදෙන සමහර ශබ්ද සංස්කෘත භාෂාවෙහි නැත. මූර්ධජ ළ යන්න මෙනි. ඒ භාෂා දෙකේ ම ඇති සමහර ශබ්ද සිංහලයෙහි නැත. අපේ භාෂාවේ ඇති ඇ යන්න හා ඈ යන්න වැනි ස්වර ශබ්දත් සඤ්ඤක ශබ්දත් සංස්කෘතයෙහි හෝ පාලියෙහි නැත.

සිංහල කව් ලැකියෙහි යෙදෙන්නේ සිංහල අපට ම ආවේණික ශබ්ද පද්ධතිය පමණකි. සංස්කෘත හා පාලි යන භාෂාවලින් ගත් තත්සම පද අපේ ශබ්ද රටාවට ගැළපෙන අයුරින් සකස් කර ගැනීමට කව්ලැකිය හැදෑරුවෝ දැන සිටියහ. භාෂාවකට අයත් ශබ්දත් ඒ ශබ්ද විධිමත් ආකාරයෙන් සංයෝග කිරීමත් 'ශබ්ද නිර්මිතය' යන නමින් හැඳින්විය හැකි ය.

(ලකුණු: 10)

www.sinhalaguru.lk

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල භාෂාවේ දියුණුව උදෙසා පතිරාජ පිරුවන්පති හිමියන් සිදත් සඟරාව ලිවීමෙන් භාෂාවට වියරණ ග්‍රන්ථයක් එක් විය. සිංහල බසෙහි ජනප්‍රියතාව මෙකල බිහි වූ සද්ධර්මරත්නාවලියෙන් ද, පූජාවලියෙන් ද දිස් වූ අතර, සිංහල බසෙහි විදග්ධ බව කව්සිළුමිණ වෙතින් ප්‍රකට විය. සිංහල කාව්‍යයෙහි මුදුන්මල ලෙසින් ද පිළිගැනෙන කව්සිළුමිණ, දෙවන පැරකුම්බාවන්ගේ භාෂා ඥානය මෙන් ම සෞන්දර්ය ඥානය ද ප්‍රකට කරයි. අනෙක් පසින් මෙම රජතුමාගේ ධර්ම ඥානය විකසිත කෙරෙන විශිෂ්ට ග්‍රන්ථයක් වූ විසුද්ධි මාර්ග සන්නස මෙකල සාහිත්‍යයට එක් වෙයි. එය සිංහල සාහිත්‍යයේ බිහි වූ ගැඹුරුතම ධර්ම ග්‍රන්ථය වෙයි. එය සංස්කරණය කොට නූතන පරපුර වෙත දායාද කළෝ බෙන්තර සද්ධාතිස්ස මහා ස්වාමීන්ද්‍රයෝ ය.

බුදුන්ගේ අරහං ගුණය විෂය කොට බුදුපුත් හිමියන් රචනා කළ පූජාවලිය දෙවන පැරකුම්බාවන් විසින් මඟුලැතු පිට තබා දෙපෝයක් තිස්සේ පූජා පවත්වා ශ්‍රී ලංකා රාජ්‍යයෙන් පිදුම් කළේ ය. එසේ වූ වෙනත් කෘතියක් සිංහල සාහිත්‍යයට නොමැත. මෙකල රාජ සභාවෙහි සිට පොදු ජනයා දක්වා ධර්මය ඉගෙනීමට තිබූ කැමැත්ත පූජාවලියෙන් පෙන්වයි. පූජාවලිය හැරුණු කල්හි දඹදෙණි යුගය අමරණීය කළ පොදු ජනතාවගේ බණ පොත සද්ධර්මරත්නාවලියයි. සිංහල ගද්‍ය ප්‍රබන්ධ අතරෙහි අග්‍රස්ථානය හිමි වන මේ කෘතිය ඔස්සේ සිංහල සාහිත්‍යයේ දේශජ ලක්ෂණ ඉස්මතු කෙරිණි. සිංහලයන්ගේ දිවි පෙවෙත පළමු වරට සාහිත්‍යයෙන් නිරූපණය කරන ගැමි රසවතා ධර්මසේන යතිවරයන් වහන්සේ ය. මට්ටකුණ්ඩලියට වැරදි අවස්ථාවෙහි ප්‍රතිකාර යෝජනා කිරීම ධර්මසේන යතිවරයන්ට අනුව 'ආඳා යවා තබාලා වල්පත ගැනීම'කි. සාමාන්‍ය ගැමියෝ මට්ටකුණ්ඩලී කතාව ම ආඳාගේ කතාවෙන් උගත්හ. මනුෂ්‍යයන්ගේ පොදු දුබලතා සාහිත්‍යයෙන් සුවපත් කළ මහා වෙදදුරාණෝ ධර්මසේන හිමියෝ ය.

ස්වර්ණමාලි ඉතිහාසයත්, එහි ශ්‍රේෂ්ඨ නිමැවුම්කරු දුටුගැමුණු නරේන්ද්‍රයාත් වර්ණිත කොට මෙකල පාලි ථූපවංසය රචනා වීම ද විශේෂත්වයක් වන්නේ පසුකාලීනව මෙය සිංහලයට හැරී වංසකතා සාහිත්‍යය එළිය කළ බැවිනි.

(i) ඡේදයේ සඳහන් වන පරිදි සිංහල බසෙහි ජනප්‍රියතාව ඇතිවූයේ කුමන ග්‍රන්ථ නිසා ද?

(ii) සිංහලයෙහි බිහි වූ ගැඹුරුතම ධර්ම ග්‍රන්ථය ලෙස මෙහි දක්වා ඇති ග්‍රන්ථය කුමක් ද?

(iii) ඡේදයට අනුව පූජාවලිය කෘතියෙහි දැකිය හැකි විශේෂතා දෙකක් ලියන්න.

(iv) සාමාන්‍ය ගැමි ජනයා ධර්මයෙන් සුවපත් කළ කතාකරුවා ලෙස දක්වා ඇත්තේ කවුරුන් ද?

(v) වංශකතා සාහිත්‍යය එළිය කිරීමට උපකාරී වූ කෘතිය ලෙස ඡේදයේ දක්වා ඇති කෘතිය කුමක් ද?

(ලකුණු 10)

05. දුම්රියෙහි ගැටීමෙන් වාර්ෂිකව අලි ඇතුන් විශාල ප්‍රමාණයක් මිය යෑම අවාසනාවන්ත සිදුවීමකි. වසරකට දහසකට වැඩි ප්‍රමාණයක් විවිධ අනතුරු හේතුවෙන් වන අලි මිය යති. දුම්රියේ ගැටීමෙන් අලි ඇතුන් මිය යාම මේ අතර ප්‍රධාන ගැටලුවකි. මෙයට විසඳුමක් ලෙස මහව ජාතික පාසලේ කවිඳු ගුණරත්න සිසුවා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් විද්‍යුත් පරිපථයක් සාදා තිබේ. GSP තාක්ෂණය (ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය) උදව් කරගනිමින් නිපදවා ඇත. දුම්රිය ධාවනයේ යෙදෙන රියදුරන්ට මේ මගින් අකාලයේ මිය යන වන අලින්ගේ ජීවිත ආරක්ෂා කර ගත හැකි ය. මේ නව නිපැයුම පිළිබඳව පුවත්පතක පළකළ හැකි පුවත්පත් වාර්තාවක් නිර්මාණය කරන්න. මහව වාර්තාකරු ඔබ යැයි සිතන්න. (වචන 150ක් වත් තිබිය යුතු ය.)

නැතහොත්,

මැල්සිරිපුර 'පැරකුම්' ගොවි සංවිධානය විසින් ප්‍රදේශයේ එළවළු හා පලතුරු ගොවියන් සමග සාකච්ඡා කර අතිරික්ත එළවළු හා පලතුරු විජලනය කර (වියළා) දේශීය හා විදේශීය වෙළෙඳපොළට නිකුත් කිරීමේ අලුත් වැඩසටහනක් ආරම්භ කර ඇත. නාස්තිය වැළැක්වීම, කල්තබා ගැනීම, පෝෂණ ගුණයේ වෙනසක් නොවීම, ලාභදායකවීම, කිසිඳු රසායනික ද්‍රව්‍යයක් මිශ්‍ර නොවන බව පාරිභෝගිකයාට දන්වමින් වියළි එළවළු හා පලතුරු නිෂ්පාදන 'සුරස' නිපැයුම් නමින් වෙළෙඳපොළට හඳුන්වා දීමට සුදුසු පුවත්පතක පළ කළ හැකි පුවත්පත් වෙළඳ දැන්වීමක් නිර්මාණය කරන්න.

(ලකුණු 15)

www.sinhalaguru.lk

සියලු ම හිමිකම් ඇවිරිණි.



අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය III

පැය දෙකයි.

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

සිංහල ගුරුකුමා YouTube Channel
සිංහල ගුරු

01. **(i) සිට (x) තෙක් ඇති සියලු ම කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) 'මැණියන් වහන්ස, මා දන්නේ මෙපමණෙක් ම ය. ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව'
(අ) මෙසේ කියූ අය කවුරුන් ද?
(ආ) මෙහි 'පසිඳුව මැනව' යනුවෙන් කීවේ කාගේ ගැටලුව ද?

(ii) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලසී
______________________________ __________
(අ) ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) මේ පද්‍ය උපුටා ගත් පද්‍ය නිර්මාණය කුමක් ද?

(iii) වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
මුවපත් වූයේ නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම්දෝ
මුළා වී මග නොපෙනේ
(අ) මෙහි එන පරිදි පුතු විසින් සිදුකළ වරද කුමක් ද?
(ආ) මුළාවී ඇත්තේ කවුරුන් ද?

(iv) 'වහන්සෙ, ඇපි උන් වඳුම්හ. දුටු කලැ හුනන්සෙන් නැඟෙම්හ.'
(අ) මෙය පැවසුවේ කවුරුන් විසින් කා හට ද?
(ආ) මෙසේ වැඳුම් පිදුම් කර උපස්ථාන කරන්නට යන්නේ කවුරුන් විසින් කා හට ද?

(v) 'තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි.'
(අ) මෙය ඇතුළත් කතා පුවත කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයා කවු ද?

(vi) 'මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
කිර'ඹ පාතුරු මී රස ලැබ වෙන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට
(අ) මෙයින් වර්ණනා වන විහාරස්ථානය කුමක් ද?
(ආ) පද්‍යයෙහි ඇතුළත් උපමාවක් හා උපමේයක් වෙන්කර ලියන්න.

(vii) මා කී දේ දෙයියනි බොරුවක්ම නැති
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇති
ඇසට වෙහෙස ඇති තුන්යමට නිදි නැති
ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද පැසෙති

(ඇ) මෙම කවි විශේෂය කුමන නමකින් හඳුන්වා තිබේ ද?
(ආ) මෙහිදී කවියා බොරුවක් නොවන බව පවසන්නේ කුමක් ද?

(viii) මේ මොන කරදරයක්වත් නැනේ. අපේ ගෙදරටත් ඒදණ්ඩකින් ගොඩ වෙලා එන්ඩ තිබුණ නම් !'

(ඇ) මෙය පැවසුවේ කවුරුන් විසින් ද?
(ආ) මෙසේ පවසන තැනැත්තාට කරදරයක් වූයේ කුමකින් ද?

(ix) 'ඔයාගේ හිතට මේවායින් මොකක් අල්ලයි ද කියලා නම් මට කියන්න බෑ.'

(ඇ) මෙය පැවසුවේ කවුරුන් විසින් ද?
(ආ) මෙය ඇතුළත් කෘතියේ පරිවර්තකයා කවුරුන් ද?

(x) (ඇ) සිංහල ව්‍යාකරණය හැදෑරීමට ගත හැකි පැරණිත ම කෘතිය වන්නේ කුමක් ද?
(ආ) එය රචනා වූ යුගය ලෙස සැලකෙන්නේ කුමන යුගය ද?

02. **(i) සිට (iv) තෙක් ඇති ගද්‍ය හා පද්‍ය කොටස් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) බෝධිසත්වයන් වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යෝධයන්ට අතින් මුහුණින් උසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් **අක්‍රෝෂ පරිභව** බෙණෙමින් ගහට කරන්නාහ. මච්ඡ මාංස හා කන බොන දෑ හා රා විත් ඔඩම් ආදිය පුරා ගෙන පිටත සිටින්නවුන්ට දික් කොට **පුළු ගන්වා** නැවත තුමූම කන්නාහ.

(ඇ) මෙයට අදාළ අවස්ථාව ඉතා කෙටියෙන් විස්තර කර ලියන්න.
(ආ) **'අක්‍රෝෂ පරිභව'**, **'පුළු ගන්වා'** යන පදවල අර්ථ දක්වන්න.

(ii) '**වෙසෙසින්** යන නද දිගත පුරායා
අසමින් තුරු හිස රඳන ගිරායා
**උමුවෙන්** මී අඹ ගත් මියුරායා
දුමුවෙන් වෙණ නදමය මියුරායා'

(ඇ) මෙම කවිය තුළින් විස්තර වන සිදුවීම ඉතාම කෙටියෙන් ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(iii) 'මහ තෙරුන් 'මහණුවම් කෙරෙමි'යි කමටහන් ගෙනැ උන් කල්හි අටවියෙහි මිනිසුන් මැරූ තැන් මැ පහළ වෙයි. 'වහන්ස දුගීමි. බොහෝ දරු බිළිඳුන් ඇත්තෙමි. මට දිවි දෙව'යි මරණ බියෙන් වලප්නා පරිදි දු, අත් පා සපන පරිදි දු **ආපාතයට** එයි. ඔහු **විපිළිසර ඇති** වැ හුන් තැනින් නැගී යෙති.'

(ඇ) මෙසේ කමටහන් ගෙන මහණුවම් කරන්නට ගිය තැනැත්තා කවුද? ඔහුට සිදුවූ අකරතැබ්බය කුමක්ද?
(ආ) **'ආපාතයට එයි'**, **'විපිළිසර ඇතිවැ'** යන පද අර්ථ දක්වන්න.

(iv) දුටු සත සිතට තුටුවන ලෙසට නිතියෙනී
සතරත එකට සම කර බෙර ඇසක් මෙනී
පැහැපත සුදු නොහළ වැලි අතුළ මළු තැනී
**මිහිකත සඳන්'ලෙව්** දුන් උර මඬල වැනී

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) පද්‍යයෙහි ඇතුළත් උපමාලංකාරයක් ලියන්න.

www.sinhalaguru.lk

(v) ග නේ මිණි බැබැළි කිරණෙව් **සතපාය**
ර නේ යට'ග සැවුලිඳු දද ගළපාය
අ නේ ලකර කළ පුර අප නරපාය
පෙ නේ දකුණැ මහසෙන් දෙව් රද පාය

(අ) මේ පද්‍යයෙන් විස්තර වන්නේ කාගේ ප්‍රාසාදයක් ගැන ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ලකුණු: 20)

- **අංක 03 හා 04 ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න දෙකක් පමණක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

03. (අ) සජීවී අවස්ථා නිරූපණයත්,
(ආ) භාෂාව හැසිරවීමේ අපූර්වත්වයත්,
අමාවතුරේ කතා රසයට හේතුවී තිබේ. අඟුල්මල් දමනය ඇසුරෙන් සුදුසු නිදසුන් අවස්ථා දෙක බැගින් යොදාගෙන පහදන්න.

නැතහොත්

(අ) රමණීය වන වැනුමෙනුත්,
(ආ) පැරණි සමාජ ආර්ථික තොරතුරුවලිනුත්
මග විසිතුරු පද්‍ය නිර්මාණය සමන්විත ය. එක් කරුණකට සුදුසු නිදසුන් පද්‍ය දෙක බැගින් යොදාගෙන පහදන්න.

04. (අ) ලද දෙයින් සෑහීමට පත් නොවීම ජීවිත විනාශයටත්,
(ආ) සිහින ලෝකවල ජීවත්වීම සැබෑ ජීවිතය මගහැරී යාමටත්
හේතුවන අයුරු දියමන්ති මාලය කෙටි කතාවේ මැටිල්ඩාගේ චරිතය ඇසුරෙන් විමසන්න.

නැතහොත්,

(අ) ළමා සිත්හි වීරත්වය ඇති කිරීමට ද,
(ආ) යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම කියා දීමට ද,
මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය සමත්ව තිබේ. එක් කරුණකට නිදසුන් දෙක බැගින් යොදාගෙන පහදන්න.

(ලකුණු: 15)

- **පහත දැක්වෙන අංක 05, 06 හා 07 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකක් තෝරා ගෙන පිළිතුරු ලියන්න.**

05. **'සිංහයා සැඟවුණු ප්‍රේමයකින් සිය බිරිඳ හා දරුවන් ආරක්‍ෂා කළ සැබෑ පියෙකි'** සුදුසු අවස්ථා තුනක් නිදසුන් සේ යොදාගෙන මේ අදහස පහදන්න.

06. කෘෂිකර්මාන්තය සමග බැඳී ඇති **සිරිත් විරිත්** හා **ගැමි විශ්වාසයන්** කුරක්කන් කවිවලින් ප්‍රකට වේ. සුදුසු පද්‍ය තුනක් නිදසුන් ලෙස යොදා ගෙන පහදන්න.

07. 'වැත්තෑවේ හාමුදුරුවෝ **අපූර්ව කවි සංකල්පනා** ගොඩනැගීමේ සමත් යතිවරයෙකි.' සුදුසු පද්‍ය තුනක් යොදා ගෙන පහදන්න.

(ලකුණු: 10)

www.sinhalaguru.lk

රසංජන කලුන්ගල්ල
*Ladies College, Colombo 07*

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

### බහුවරණ පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 1 | 21 | 3 | 31 | 1 |
| 02 | 1 | 12 | 2 | 22 | 4 | 32 | 4 |
| 03 | 3 | 13 | 1 | 23 | 4 | 33 | 2 |
| 04 | 2 | 14 | 3 | 24 | 1 | 34 | 3 |
| 05 | 4 | 15 | 3 | 25 | 3 | 35 | 3 |
| 06 | 3 | 16 | 2 | 26 | 2 | 36 | 3 |
| 07 | 2 | 17 | 3 | 27 | 3 | 37 | 2 |
| 08 | 3 | 18 | 4 | 28 | 2 | 38 | 1 |
| 09 | 4 | 19 | 1 | 29 | 4 | 39 | 2 |
| 10 | 3 | 20 | 2 | 30 | 2 | 40 | 2 |

www.sinhalaguru.lk

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

**01.** (i) (අ) ය, ර, ල, ව - එක අකුරක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(ආ) ඞ, ඤ, ණ, න, ම - එක අකුරක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ii) (අ) අත්‍යාවශ්‍ය - අත්‍යවශ්‍ය
(ආ) ධූරයේ - ධුරයේ

(iii) (අ) ගැමි + ඕ = ගැමියෝ - ආගම සන්ධිය
(ආ) මහ + උපකාර = මහෝපකාර - ස්වරාදේශ සන්ධිය

(iv) (අ) ලියන
(ආ) කෙරිණි

(v) (අ) දිගැසි - අන්‍යාර්ථ සමාසය
(ආ) රන්රිදී - 'ද' කාරාර්ථ සමාස

(vi) (අ) මාතෘ භාෂාව - මවුබස
(ආ) පුවත් සිරස්තල - ප්‍රවෘත්ති ශීර්ෂ පාඨ

(vii) (අ) පෙරළා - පූර්ව ක්‍රියාව
(ආ) බලවු - විධික්‍රියාව

(viii) (අ) අවධි විභක්තිය
(ආ) සම්ප්‍රදාන විභක්තිය

(ix) (අ) ගුරුවරුන් විසින් සිසුහු දැනුවත් කරනු ලබති./ ලැබෙති./ කෙරෙති.
(ආ) වෛද්‍යවරයා විසින් රෝගීන්ගේ සුවදුක් විමසා බලන ලදී./ බලනු ලැබිණි./ බැලිණි.

(x) (අ) ශිෂ්‍යයන් පාසල පිරිසිදු කරතියි, ගුරුතුමා සිතුවේ ය.
(ආ) අපි අසල්වාසීන්ගේ මිතුරෝ වෙමු.

02. රචනාව සඳහා ලකුණු ලැබෙන පිළිවෙළ

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාව, මාතෘකාව ද ඇතුළුව | - ලකුණු 08 |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - ලකුණු 12 |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - ලකුණු 05 |
| | මුළු ලකුණු | - 25 |

**(අ) මත් උවදුරෙන් තොර සුරක්ෂිත රටක් ගොඩනගමු**

මත්ද්‍රව්‍ය උවදුර අද සමාජයේ නිහඬව පැතිරෙන නමුත් දැඩි ලෙස විනාශය ගෙන එන අභියෝගයකි. එය පුද්ගලයකුගේ ජීවිතය පමණක් නොව පවුල, සමාජය සහ සමස්ත රටම කම්පා කරවන වසංගතයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම රටේ ළමා පරපුර හා තරුණ පරම්පරාව මත්ද්‍රව්‍යවලට ගොදුරු වීම රටක අනාගතය අඳුරු කරවන භයානක ලක්ෂණයකි.

ළමා වයසෙහි සිටම වැරදි සමාජ ආශ්‍රය, දුර්වල පවුල් පසුබිම, අධ්‍යාපන පීඩනය හා අවධානයේ අඩුව මත්ද්‍රව්‍යවලට ඇදී යාමට හේතු වේ. එමගින් අධ්‍යාපන ජීවිතය බිඳ වැටෙයි, සමාජ විනය නැතිවෙයි, අපරාධ හා අසභ්‍ය හැසිරීම් වැඩිවේ. තරුණ පරපුර මත්ද්‍රව්‍යවලට ලොල්වීමෙන් රටේ ශ්‍රම බලකාය දුර්වල වී ආර්ථිකයට දැඩි පීඩනයක් එල්ල වේ. උපයන මුදල් සංවර්ධනයට නොව ප්‍රතිකාර හා සමාජ ගැටලුව විසඳීමට වැය වීම දුර්භාග්‍යයකි.

මෙවැනි තත්ත්වයකින් ගොඩ ඒමට නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව කටයුතු කිරීම, පාසල් හා සමාජය තුළ මත්ද්‍රව්‍ය වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. ඒ සමගම අධ්‍යාපන හා ආගමික ආයතන මඟින් සදාචාරාත්මක වටිනාකම් පෝෂණය කළ යුතුය.

මත්ද්‍රව්‍යවලට ගොදුරු වූවන්ට දඬුවම් පමණක් නොව පුනරුත්ථාපන අවස්ථා ලබා දීමද සමාජ වගකීමකි. ඔවුන් නැවත සමාජයට එකතු කරගැනීමෙන් සමාජය ශක්තිමත් වේ. එබැවින් මත් උවදුර රටින් තුරන් කිරීමට රජය, නීතිය, පාසල්, පවුල් හා සමාජය එක්ව පෙළ ගැසීම අද අප සැමගේම අත්‍යවශ්‍ය වගකීම වේ.

www.sinhalaguru.lk

**(ආ) අලි ඇතුන් රැකගැනීම ජාතික වගකීමකි**

අලි ඇතුන් යනු ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් ලෙස සැලකෙන, රටට විදේශ විනිමය ගෙන දෙන අතිශය වටිනා සම්පතකි. විශේෂයෙන්ම විදේශ සංචාරකයන්ගේ දැඩි ආකර්ෂණයට ලක්වන මෙම සතුන් අප රටේ වනජීවී සංචාරක කර්මාන්තයේ ප්‍රධාන තැනක් හිමිකරගෙන ඇත. එහෙත් මෑත කාලය තුළ දිනෙන් දින අලි ඇතුන් මිය යාම ඉතා කණගාටුදායක තත්ත්වයක් බවට පත්ව ඇත.

අලි-මිනිස් ගැටුම මේ තත්ත්වයට ප්‍රධාන හේතුවක් වී ඇත. වනාන්තර විනාශය, ගොවි බිම් පුළුල් කිරීම සහ මිනිස් වාසය අලි වාසස්ථාන වෙත පැතිර යාම හේතුවෙන් අලි ගම්වලට ඇතුළු වීම වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විදුලි වැටවල්, වෙඩි තැබීම්, වළවල් හා විෂ ද්‍රව්‍ය භාවිතයෙන් අලි මරා දමන සිද්ධීන් වැඩිවී තිබේ. එමෙන්ම දුම්රිය හා මහාමාර්ග අනතුරු හේතුවෙන් ද බොහෝ අලි ජීවිත අහිමි වෙයි.

මෙවැනි තත්ත්වයකදී රජය හා නීතියේ භූමිකාව අතිශය වැදගත් වේ. අලි ආරක්ෂා කිරීම සඳහා කාර්යක්ෂම නීති ක්‍රියාත්මක කිරීම, ආරක්ෂිත අලි මාර්ග නිර්මාණය කිරීම හා ජනතාවට නිසි අවබෝධය ලබා දීම අවශ්‍ය වේ. නමුත් නීතිය පමණක් ප්‍රමාණවත් නොව, ජනතාවගේ තේරුම් ගැනීම හා වගකීම ද අත්‍යවශ්‍යය.

අලි ඇතුන් රැකගැනීම යනු සතුන් රැකගැනීමක් පමණක් නොව, අපේ රටේ අනාගතය හා ස්වභාවික සම්පත් රැකගැනීමක් ද වේ. එබැවින් රජය, සමාජය හා එක් එක් පුද්ගලයා එකට එක්ව ක්‍රියා කළහොත් අලි ඇතුන්ට සුරක්ෂිත රටක් ගොඩනගා ගත හැකි වනු ඇත.

**(ඉ) සංවර්ධනයේ මූලික පදනම ශක්තිමත් පොදු ප්‍රවාහනයයි**

දිනපතා සිදුවන මාර්ග තදබදය, රිය අනතුරු, ඉන්ධන අධික ලෙස දහනය වීම හා කාලය නාස්ති වීම අද අප සමාජයේ දැඩි ගැටලුව බවට පත්ව ඇත. මෙම ගැටලුව බොහෝමයක් සඳහා මූලික හේතුවක් වන්නේ ශක්තිමත්, සුවපහසු හා කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවාවක් නොමැතිවීමයි. රටක සංවර්ධනයේ වේගය

තීරණය වන්නේ එරට පොදු ප්‍රවාහන පද්ධතියේ ගුණාත්මකභාවය මත බව අවිවාදයෙන් පිළිගත යුතු සත්‍යයකි.

අද බොහෝ දෙනා තම වටිනා කාලය පැය ගණනක් මහමග ගත කරති. කාර්යාල සේවකයෙකු, ශිෂ්‍යයෙකු හෝ ව්‍යාපාරිකයෙකු වුවද, මාර්ග තදබදය හේතුවෙන් ඔවුන්ගේ කාර්යක්ෂමතාව දැඩි ලෙස අඩුවෙයි. එමඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවාවන්හි ප්‍රමාදය හා අකාර්යක්ෂමතාවය ද ඉහළ යයි.

ශක්තිමත් පොදු ප්‍රවාහන සේවාවක් තිබේ නම් පුද්ගලික රථවාහන භාවිතය අවම කළ හැකි අතර එය ඉන්ධන ඉතිරි කිරීමට, වායු දූෂණය අඩු කිරීමට හා අනතුරු අවම කිරීමටද උපකාරී වේ. සුවපහසු, නියමිත වේලාවට ධාවනය වන බස්, දුම්රිය හා නවීන ප්‍රවාහන ක්‍රම ජනතාවට විශාල පහසුවක් සලසයි.

එබැවින් රජය හා පෞද්ගලික අංශය එකට එක්ව ඉතා උසස් පොදු ප්‍රවාහන සේවාවක් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි සේවාවක් තුළින් කාලය, ඉන්ධන හා මිනිස් ජීවිත රැකගනිමින් සැබෑ සංවර්ධනයක් කරා රට ගෙන යා හැකි වේ.

**(ඊ) විදුලි රථවාහන පරිසර හිතකාමී අනාගතයට පියවරකි**

අද ලෝකය මුහුණ දෙන ප්‍රධාන පාරිසරික ගැටලුවක් වන්නේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා වායු දූෂණයයි. මේ සඳහා ප්‍රධාන හේතුවක් ලෙස පොසිල ඉන්ධන භාවිතයෙන් ධාවනය වන රථවාහන හඳුනාගත හැක. එබැවින් ඉන්ධන දහනය කරන සාම්ප්‍රදායික රථවාහන වෙනුවට විදුලි බලයෙන් ධාවනය වන නවීන රථවාහන වෙළෙඳපොළට වේගයෙන් පැමිණීම ලෝකයටම වැදගත් වෙනසකි.

විදුලි රථවාහන භාවිතයෙන් වායු දූෂණය සැලකිය යුතු ලෙස අඩු කළ හැකි අතර ඉන්ධන ආනයනය මත රටක් පවතින ආර්ථික පීඩනය ද අවම කළ හැක. විදුලි බලය නවීන හා පරිසර හිතකාමී ශක්ති ප්‍රභවයකි. එමෙන්ම විදුලි රථවාහන අඩු ශබ්දය, අඩු නඩත්තු වියදම් හා වැඩි කාර්යක්ෂමතාවය වැනි වාසි රැසක් ද සපයයි.

ලොව ප්‍රධාන පෙළේ දියුණු රටවල් මේ වන විට පොදු ප්‍රවාහන මාධ්‍ය පවා විදුලි බලයට පරිවර්තනය කරමින් සිටිති. විදුලි බස්, දුම්රිය හා ට්‍රෑම් පද්ධති භාවිතයෙන් පරිසර දූෂණය අඩු කර ජනතාවට සුවපහසු ගමන් පහසුකම් ලබා දීමට ඔවුන් සමත් වී ඇත.

අප රටද මෙම නවීන ප්‍රවණතාවය සමඟ ගමන් කළ යුතුය. විදුලි රථවාහන භාවිතය ප්‍රවර්ධනය කිරීමෙන් පරිසරය රැකගෙන අනාගත පරපුරට සුරක්ෂිත ලෝකයක් උරුම කර දිය හැක. එබැවින් විදුලි බලයෙන් ධාවනය වන රථවාහන පරිසර හිතකාමී අනාගතයක් කරා ගෙන යන වැදගත් පියවරක් බවට සැලකිය හැක.

03. සාරාංශකරණය පිළිතුර :

1. මිනිසාගේ විශිෂ්ට නිර්මාණය භාෂාවයි. ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය එයින් ගොඩ නැගුණි.
2. භාෂාව කතා කිරීම ප්‍රාථමික ක්‍රියාවයි. එම ශබ්ද උගුර, දිව ආදී අවයවවලින් නිකුත් වේ.
3. උච්චාරණය අවයව පද්ධතිය එකක් වුවත් උච්චාරණ ශබ්ද වෙනස් වේ.
4. දෙමළ, පාලි, සංස්කෘත යන භාෂාවල පවතින අකුරු ශබ්ද ද එකිනෙකට වෙනස් ය. ඇ, ඈ යන ස්වර හා සඤ්ඤක අකුරු පාලි සංස්කෘතවල නැත.
5. කව්ලැකියෙහි ඇත්තේ සිංහලයට ආවේණික ශබ්ද පමණි. කව්ලැකිය දත්තෝ ඒවා සැකසූහ.
6. භාෂාවක ශබ්ද විධිමත්ව සංයෝග කිරීම ශබ්ද නිර්මිතයයි.

මිනිසාගේ විශිෂ්ට නිර්මාණය භාෂාවයි. මානව ශිෂ්ටාචාරයේ හා සංස්කෘතිය එයින් ගොඩ නැගී ඇත. භාෂාව කතා කිරීම ප්‍රාථමික ක්‍රියාවයි. එහි ශබ්ද උගුර, දිව ආදී අවයවවලින් නිකුත් වේ. මිනිසාගේ උච්චාරණ අවයව පද්ධතිය එකක් වුවත් ශබ්දෝච්චාරණය වෙනස් වේ. අප්‍රිකානු කිකුයු භාෂාවේ ශබ්ද ඊට නිදසුනකි. දෙමළ, පාලි, සංස්කෘත යන භාෂාවල පවතින අකුරු ශබ්ද එකිනෙකට වෙනස් ය. ඇ, ඈ යන ස්වර හා සඤ්ඤක අකුරු පාලි සංස්කෘතයේ නැත. කව්ලැකියෙහි ඇත්තේ සිංහලයට ආවේණික ශබ්ද පමණි. කව්ලැකිය දත්තෝ ඒවා සැකසූහ. භාෂාවක ශබ්ද විධිමත්ව සංයෝග කිරීම ශබ්ද නිර්මාණයයි. (වචන ගණන 77)

www.sinhalaguru.lk

04. අවබෝධය

1. සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය ග්‍රන්ථවලින්
2. විසුද්ධි මාර්ග සන්නස
3. රජුගෙන් පූජා ලැබීම.
   රාජ සභාවේ සිට සාමාන්‍ය ජනයා දක්වා ධර්මය ඉගෙනීමට ඇති කරවීම.
4. ධර්මසේන හිමියන්
5. පාලි ථූපාවලිය

(ලකුණු 5 × 2 = 10)

හැකිතරම් කෙටි පිළිතුරු ලියන්න. කරුණු දෙකක් අසා ඇතිවිට අනිවාර්යයෙන්ම එම කරුණු දෙක ලිවිය යුතුය.

05.

# යකඩ යකාගෙන් අලි ඇතුන් රැකගන්න නව නිපැයුමක්...

මහව වාර්තාකරු - කිත්සිරි

**ශ්‍රී ලංකාව ලොව ලස්සන ම අලි ඇතුන් ජීවත් වන සුන්දර දිවයිනකි. විශාල සංචාරකයින් පිරිසක් අලි ඇතුන් නැරඹීමට මෙරටට පැමිණේ. එයින් අප රටට විශාල විදේශ විනිමයක් ද හිමි වේ. අලි මිනිස් ගැටුම හේතුවෙන් මෙරට වන අලි විශාල ප්‍රමාණයක් වාර්ෂිකව මිය යති. එය දිගුකාලීන විසඳුමක් නැති ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. විදුලි වැට වැනි විසඳුමකින් එයට පිළියම් සෙවීම අසාර්ථකව ඇත. විදුලි රැහැන් ඇදීම, හක්කපටස් දැමීම, වෙඩි තැබීම වැනි හිංසාකාරී ක්‍රම මගින් අලි ඇතුන් මරා දැමේ. පසුගිය වසරේ විවිධ අනතුරු හේතුවෙන් අලි ඇතුන් 400ක් පමණ මියගිය බව වාර්තා විය.**

**අලි ඇතුන්ගේ සාම්ප්‍රදායික ගමන් මාර්ග හරහා දුම්රිය මාර්ග ඉදිකිරීම හේතුවෙන් දුම්රියේ ගැටීමෙන් වාර්ෂිකව අලි ඇතුන් සිය ගණනක් මිය යාමට හා තුවාල ලැබීමට ලක්වේ. එය විශාල අපරාධයකි. මේ සඳහා විවිධ ආකාරයේ විසඳුම් කලින් කලට ඉදිරිපත් වූවත් ඒවායේ සාර්ථකත්වයක් නැත.**

**මහව ජාතික පාසලේ උසස් පෙළ විද්‍යා අංශයේ 13 වන වසරේ ඉගෙනුම ලබන කවිඳු ගුණරත්න සිසුවා** GPS **තාක්ෂණය යොදා ගනිමින් නවීන තාක්ෂණයෙන් යුතු විද්‍යුත් සංඥා පද්ධතියක් නිමවා තිබේ. මේ මගින් දුම්රිය මාර්ගයේ ඉදිරියෙන් අලි ඇතුන් රැඳී සිටී නම් ඒ පිළිබඳ දුම්රිය රියදුරාට ඇසෙන සේ විදුලි සීනුවක් නාද වෙමින් ආලෝක සංඥාවක් නිකුත් කෙරේ. කිලෝමීටරයක පමණ දුරින් මෙම සංඥාව නිකුත් වන බැවින් රියදුරුට දුම්රිය පාලනය කර නවත්වා ගැනීමට හැකියාව ලැබේ. පසුගිය සතියේ දින 7ක් පුරා පරීක්ෂා කර බලන ලද මේ නව නිර්මාණය ඉතා සාර්ථක නිමැවුමක් බව දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් මාධ්‍යයට පැවසී ය.**

www.sinhalaguru.lk

# 'සුරස'

## වියළි එළවළු හා පලතුරු
## මැල්සිරිපුර 'පැරකුම්' ගොවි සංවිධානයේ නව නිපැයුමකි.

---

**මැල්සිරිපුර පැරකුම් ගොවි සංවිධානයේ ගොවියන් අතිරික්ත එළවළු හා පලතුරු විජලනය කොට ඇසුරුම් කර දෙස් විදෙස් වෙළෙඳපොළට නිකුත් කරයි.**

**සුරස නිෂ්පාදනවල ප්‍රතිලාභ :**

- එළවළු පලතුරු අස්වැන්නේ නාස්තියට තිත.
- වියළි එළවළු හා පලතුරුවලට පවත්නා දෙස් විදෙස් වෙළෙඳපොළ ජයගත හැකිවීම.
- පෝෂණ ගුණය, රසය නොනසා කල්තබා ගැනීමේ හැකියාව
- විදේශ විනිමය උපයා ගැනීමේ හැකියාව
- කල්තබා ගැනීමේ රසායනික ද්‍රව්‍ය හෝ රසකාරක මිශ්‍ර කර නැති බැගින් සෞඛ්‍යාරක්ෂිතය.

**සුරස නිෂ්පාදනවල මිල ගණන්**

ඕනෑම වර්ගයක වියළි එළවළු කිලෝ එකක මිල රු. 300 කි.
වියළි පලතුරු කිලෝ එකක මිල රු. 500 කි.
තොග හා සිල්ලරට මිල දී ගත හැකි ය.

**පෙබරවාරි මස මිල දී ගැනීම්වලට 20% ක වට්ටමක්....**

**සියලු විමසීම්**
076 112 338
033 563 789

2026-02-02

මාර්ගගත ක්‍රමයට
නිවසට ම ගෙන්වා ගැනීමට අමතන්න.
ප්‍රවාහනය නොමිලේ
077 1120 4050

**'පැරකුම්' ගොවි සංවිධානය,**
**4 ඇළ, මැල්සිරිපුර**
**විද්‍යුත් ලිපිනය :**parakum@gmail.com
**දුරකතනය : 033563787**

www.sinhalaguru.lk

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

www.sinhalaguru.lk

01. **(i) සිට (x) තෙක් ඇති සියලු ම කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා
(ආ) තරුණයාගේ හා මහල්ලාගේ කහවණු දාහක නඩුව

(ii) (අ) දිසිමෙන් විය විදුලිය සිය දහසි
(ආ) ගුත්තිල කාව්‍යය

(iii) (අ) පියාගේ අණ නොතකා ගල්ලෙන බිඳ ලෙන් දොර හැරීම.
(ආ) සුප්පා දේවිය

(iv) (අ) කොසොල් රජතුමා විසින් බුදුන් වහන්සේට
(ආ) අංගුලිමාල තෙරුන් වහන්සේට

(v) (අ) උග්ගසේන සිටුපුත්හුගේ කතා වස්තුව
(ආ) ධර්මසේන හිමි

(vi) (අ) කැරගල විහාරස්ථානය
(ආ) උපමානය - පොළොව නැමැති කාන්තාවගේ මුහුණ සේ
නෙළුම්මල්වල පැණි උරා බොන්නාක් මෙන්
උපමේය - බබළන කැරගල විහාරස්ථානය
විහාරස්ථානයේ විසිතුරු නරඹා නෙත සිත සතුටු කර ගැනීම.

(vii) (අ) කුරක්කන් වගාවේ දී
(ආ) කුරක්කන් වගාවට සිවුපා සතුන්ගෙන් හානි ඇතිවන බව

(viii) (අ) හේරත් / කථකයාගේ පියා
(ආ) මහජන සෞඛ්‍ය පරිපාලකවරයාගේ වැසිකිළියක් සෑදීමේ යෝජනාව
පරීක්ෂකවරයාගේ පැමිණීම

(ix) (අ) ෆෙරොස්ටියර් මහත්මිය
(ආ) කේ. ජී. කරුණාතිලක

(x) (අ) සිදත් සඟරාව
(ආ) දඹදෙණි යුගය

02. (i) (අ) මහෞෂධ පණ්ඩිතයන්ගේ මියුලු නුවර වැසියන් සාද පවත්වමින් නුවර වටකරගෙන සිටින චූලනී රජතුමාගේ සෙබළුන්ට උසුළු විසුළු කරන අවස්ථාව
(ආ) කෝපයෙන් බැණ වැදෙමින්/ ආශා ඇතිකරවා

(ii) (අ) මී අඹ කමින් ගස් මුදුන්වල සිටි ගිරවුන්ට ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදය ඇසී එයින් මත්ව හොටෙන් ගත් මී අඹ බිම බිම දැමීමේ සිදුවීම.
(ආ) විශේෂයෙන්
උන්ගේ හොටවලින්/ ගිරවුන්ගේ හොටවලින්

(iii) (අ) අංගුලිමාල තෙරුන් වහන්සේ
ඔහු මරා දමන ලද මිනිසුන් අවතාර ලෙසින් පැමිණ තෙරුන්ගේ භාවනාවට බාධා කිරීම.

(ආ) සිහියට එන්නේ ය.
කැලඹුණු සිතිවිලි ඇතිව

(iv) (අ) පොළොව නමැති කාන්තාව
සඳුන් තවරන ලද
(ආ) සමතලා මිදුල් බෙර ඇසක් වැනි ය.
සුදු වැලි ඇතිරූ මිදුල මිහිකතගේ සඳුන් තැවරූ උර මැඳුර වැනි ය.

(v) (අ) කතරගම දෙවියන්ගේ ප්‍රාසාදය
(ආ) හිරු, සූර්යයා
කුකුළා

03. අඟුල්මල් දමනය - විචාර පිළිතුර

**පොළොන්නරු සාහිත්‍ය යුගයේ විශිෂ්ට නිර්මාණකරුවකු වූ ගුරුළුගෝමී පඬිවරයා විසින් බුදුන් වහන්සේගේ නව අරහහාදි බුදු ගුණ අතරින් පුරිස දම්ම සාරථී නම් බුදු ගුණය ඇසුරු කරගෙන රචනා වූ අමාවතුර මාහැඟි බණකතා කෘතියකි. එහි හත්වන පරිච්ඡේදයෙහි ඇතුළත් අඟුල්මල් දමනය කතාවෙන් අංගුලිමාල දමනය කළ ආකාරය විස්තර කෙරේ. නොහික්මුණු අසංවර පුද්ගලයන් දමනය කිරීමේ විශිෂ්ට බුදු ගුණය මේ කෘතියෙන් විද්‍යමාන වේ. අංගුලිමාලගේ කායික ශක්තිය දියකර මානසික ශක්තිය අවදිකර ධර්මය අවබෝධ කරවා මිනිසුන්ට ශාන්තිය උදාකරන මහ රහතුන් කෙනෙකු බවට පත් කළ ආකාරය මෙම කතාවෙන් නිරූපිත වේ.**

(අ) ○ අමාවතුර රසවත් බණකතා කෘතියක් වන්නේ එහි ඇතුළත් කතාරසය හේතුකොට ගෙන ය. එහි ඇතුළත් කතා පුවත් රසවත් වීම කෙරෙහි පාදක වූ හේතූන් අතරින් පාඨක හා ශ්‍රාවක මනසෙහි අවස්ථා හා සිද්ධි සජීවී ආකාරයෙන් නිරූපණය කිරීම පෙන්වා දිය හැකි ය. ඒ පිළිබඳව අමාවතුර කතුවරයා සතුවූයේ විශිෂ්ට කුසලතාවයකි.

○ දිසාපාමොක් ඇදුරුතුමා විසින් අහිංසක තමා හා භේද කිරීම පැමිණි ශිෂ්‍ය කණ්ඩායම කෙරෙහි කෝපයෙන් ඔවුන් එලවා දැමූ ආකාරය සජීවී නිරූපණ අවස්ථාවකි. පලායන ශිෂ්‍යයින් ඇදුරුතුමා වෙතින් ඉවත්ව යන අවස්ථාවේ පවසන්නේ සිය අඹුව හා අහිංසක අතර බැඳීම සියසින් ම දැක ගන්නා ලෙසිනි. මේ දෙබස් මගින් එහි සජීවී බව තවත් වැඩි වී ඇත.

> **"කිම් ද දරුයෙනී ? කීයෙන් 'මෙහි ඇසෙන දූයෙක් ඇති' යි කීය. 'කිමෙක් හෝ ?' යි කීයෙන්, 'අහිංසක මානවකයා තොපට වරද්දයි ගත්තම්හ' යී කීහ. ආචාර්ය උනට දැහැව 'යටත්නි, මපුතු මා කෙරෙහි නො බිඳැ පිටවියාව...'" 'අප නොහදනා නම් තෙපි ම පිරික්සා බලව...'**

○ කොසොල් රජු සේනාව සමග දෙවුරම් වෙහෙරට ගිය අවස්ථාවේ බුදුන් වහන්සේ අත දිගුකර පැවිදි කර සිටි අංගුලිමාල භික්ෂුව පෙන්වූහ. රජු බියෙන් ගැහෙන්නට විය. පැමිණි සෙනඟ ආයුධ පවා බිම දමා පැන දුවන්නට විය. ඔවූහු ගමට ගොස් අංගුලිමාල විසින් කොසොල් රජු අල්ලා ගත් බව පැවසූහ.

> **"තුබූ මහ ජනයෝ බිය පත් වැ කඩු පළඟ දමා පියා ඒ ඒ දසායෙහි පලා නුවර වැදෑ දොර පියාලා අඟුල් ගෙනැ අටල්ලට නැඟී බලමින් සිටියාහු අඟුල්ම් සොර රජ මා කරා එ යනු දූනැ පළමු අවුදු දෙව්රම්හි හුන්නේ යැ, රජු ගත, ඇපි පලා ආවා මො දිවි ලදුම්හ."**

○ අංගුලිමාල තෙරුන් වහන්සේ ආහාර සොයමින් ගමට ගිය අවස්ථාවේ දී ගම්වැසියන් ක්‍රියාකරන ආකාරය සජීවී අවස්ථා නිරූපණයකි. තෙරුන් වහන්සේ දැක ඇතැමෙක් බියෙන් පැන ගොස් සැඟවෙන අයුරු ද, තවත් කෙනෙකු පිටුපා සිටින අයුරු ද සජීවී නිරූපණයකි.

> **"මහ තෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැක වෙවුලන් මැ යැ. දොර පියා ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා වලට හෝ වදිති. ගෙට වැද දොර පයාලා අඟුළු ගෙන් ගනිති.**

(ආ) ○ නොනැවතී ඉදිරියට ගලායන කිසියම් කලාත්මක වූ ගීතාත්මක භාෂාවක් භාවිත කිරීම ද අමාවතුරෙහි දැකිය හැකි තවත් අපූරු භාෂා ලක්ෂණයකි. අංගුලිමාලගේ විපතට මුහුණ දුන් ජනයා රජ ගෙදර මිදුලට රැස්වී තමන් මුහුණ දී සිටින පුදුම සහගත විනාශකාරී, අමිහිරි අත්දැකීම රජුට විස්තර කරමින් සිටින්නේ හති ඇරීමක් හෝ හුස්ම ගැනීමත් හෝ නොමැතිව එක දිගටම නොනවත්වා ම ය. හදිසි අවස්ථාවක යමෙකු දුටු දෑ විස්තර කරන අයුරින් එහි භාෂාව හසුරුවා ඇති අයුරු අනර්ඝ ය.

**"එකල්හි මහ ජනයෝ කොසොල් රජුගෙ ගෙවද්දොර රැස් වැ 'මහර රජ, තොපගෙ රට අඟුල්මල් නම් සොරෙකැ, දරුණු, ලෙහෙමුඬු අත් ඇත්තෙයැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තෙ යැ. ගම් නොගම් කෙළෙ, නියම් ගම් නොනියම් ගම් කෙළෙ, දනව් නොදනව් කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. ඔහු වළකා'යි කියා මහ හඬින් හැඬූ හූ."**

- සංවාදාත්මක දෙබස් සහිත නාට්‍යමය භාෂාව ද අමාවතුරේ දැකිය හැකි තවත් භාෂා ලක්ෂණයකි. බුදුන් වහන්සේ හා කොසොල් රජු, හර්ග බමුණා හා මන්තාණි බැමිණිය, බුදුන් වහන්සේ සහ අංගුලිමාල, අංගුලිමාල භික්ෂුව හා කොසොල් රජු, දිසාපාමොක් ආචාර්ය හා ශිෂ්‍යයන් අතර ඇතිවූ සංවාද නාට්‍යමය භාෂාවෙන් හා සජීවී සංවාදාත්මක භාෂාවෙන් පිරිපුන්ය.

| | |
|---|---|
| ශිෂ්‍යයන් | :- **ආචාර්යා කරා එළඹ වැඳ සිටියාහ.** |
| ආචාර්යා | :- **කිම් ද දරුයෙනි ?** |
| ශිෂ්‍යයන් | :- **මෙහි ඇසෙන දූයෙක් ඇති.** |
| ආචාර්යා | :- **කිමෙකැ හො ?** |
| ශිෂ්‍යයන් | :- **අහිංසක මාණවකයා තොපට වරද්දයි ගත්තාම් හ.** |
| ආචාර්යා | :- **යටත්නි, මපුතු මා කෙරෙහි නොබිඳැ පියටියාව.** |
| ශිෂ්‍යයන් | :- **අප නො හඳහා නම් තෙපි මැ පිරික්සා බලව.** |

- ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ අමාවතුර කතුවරයා අසා සිටින්නා තුළත්, කියවන්නා තුළත් කතාවේ අවස්ථා සජීවී ලෙස නිරූපණය කළ ආකාරය හා සිත්ගන්නා ලෙස සරල හා රසවත් ආකාරයෙන් භාෂාව හසුරුවා ගත හැකි ආකාරයයි.

මග විසිතුරු - විචාර පිළිතුර

**කෝට්ටේ සාහිත්‍ය යුගයට අයත් සැළලිහිණි සංදේශය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් සැළලිහිණියකු දූතයා ලෙස යොදා ගනිමින් කැලණියේ විභීෂණ දෙවියන් වෙත යවන ලද්දකි. ලෝකනාථා දේවියට පුත් කුමාරයෙකු ලබාදෙන ලෙස එයින් ආයාචනා කර තිබේ. සංදේශය රැගත් දූතයා කැලණිය දක්වා පියාසර කර යන අතරමග දී දැක ගැනීමට ලැබෙන නැගෙනහිරින් පිහිටි සමනල කන්ද, උතුරින් මහ මුහුද, දකුණින් කතරගම දෙවියන්ගේ දොවොල හා මුර කපොලු, වන පියස, විල් පොකුණු, අම්බලම් ආදිය ද වර්ණනා කර තිබේ. මග දෙපස සෞන්දර්යය පමණක් නොව ප්‍රභූ පුද්ගලයින් ද කවියාගේ වර්ණනාවට ලක්වී තිබේ. සංදේශය රැගෙන යන දූතයාට ඔහු යන මාර්ගයෙහි විසිතුරු බව දැක්වීම මේ පද්‍ය කොටසින් සිදුකර තිබේ. සංදේශ කවීන්ගේ උසස් වර්ණනා කුසලතාවයන් දැකගත හැක්කේ මාර්ග වර්ණනාවල දී ය.**

(අ) - සැළලිහිණි සංදේශය, සංදේශ සාහිත්‍යයේ අග්‍රගණ්‍ය කාව්‍ය කෘතිය යි. සෙසු සංදේශකරුවන්ට වඩා ඉතා උසස් කාව්‍ය ප්‍රතිභාවක් රාහුල හිමියන් සතු ය. නගර වර්ණනා, රාජ වර්ණනා හා වෙනත් පුද්ගල වර්ණනාවලට වඩා ස්වභාව සෞන්දර්ය වර්ණනාවලට වැඩි රුචිකත්වයක් දක්වා ඇති බව මාර්ග වර්ණනාවෙන් සනාථ වේ.

- ගුරුබැවුල නම් වනරොද ඉතාමත් ම අලංකාර වන පියසකි. නිතර හිරු රැස් වැටී මල් පිපුණු විල්, මත් වී නාද කරන කොවුලන්, මග දෙපස පොරකෑමට සූදානමින් සිටින වළි කුකුළන් ගුරුබැවුල කොරතම් සෞන්දර්යෙන් පිරි වන රොදක් දැයි යන්න පෙන්වා දෙයි.

**රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැවැසී**
**ම ත කො වු ලේ තුරු වදලේ හඬන නිසී**
**ව න සැ වු ලේ මග අසලේ පොර සැලැසී**
**ගු රු බැ වු ලේ යව අවුලේ නොවී කිසී**

- වනය ශ්‍රියා කාන්තාවකි. මුරුත හා දුණුකේ ගස්වල පිපුණු මල් ඇගේ මරකත මැණික්වලින් සැදි ආභරණ ය. හිම මෙන් සීතල දිය පිරුණු විල්වල බිඟුන් පිරිවරන ලද පස් පියුම් පිපී ඇත. මෙතරම් රමණීය සෞන්දර්ය වර්ණනා අන් කවර සංදේශකරුවකුගෙන් වුව ද අපේක්ෂා කළ හැකි නොවේ. සැළලිහිණි සංදේශය පුරා ම දක්නට ලැබෙන්නේ රාහුල හිමියන්ගේ රමණීය කාව්‍ය වර්ණනා චාතුර්යයි.

**ව න සි රි පියුමරා බඳ රන්'බරණ යුරු**
**ව ට පි රි සුපුල් දුනුකේ මල් මුරුත'තුරු**
**බි ගු පි රි වැරූ ඔලු'පුලැ'ඹුලවල තඹුරු**
**හි ම ස රි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු**

(ආ) කෝට්ටේ යුගයේ ලියැවුණු රමණීය ම සංදේශ කාව්‍ය කෘතිය සැළලිහිණි සංදේශය වන බව බොහෝ විචාරක මතය යි. සෞන්දර්යාත්මක වර්ණනා අතින් ද, කවියා සතු කාව්‍ය ප්‍රතිභාව අතින් ද සැළලිහිණි සංදේශය ඉතාමත් උසස් නිර්මාණයකි. මේ සියල්ල අතරතුර කෝට්ටේ යුගයට අයත් ඉතා වැදගත් සමාජ ආර්ථික තොරතුරු රැසක් ද කවියා සංදේශයට ඇතුළත් කර තිබේ.

- හයවැනි පැරකුම් රජුගේ රාජ්‍ය කාලය තුළ දී යාපා පටුනෙහි ද්‍රවිඩ අර්බුද පැවති බවත්, ඒවා පාලනය කිරීමට රජු විසින් සපුමල් කුමරා එහි සේවයෙහි යොදවා සිටි බවත්, ඔහු යාපා පටුන ජයගෙන පැමිණි බවත්, සමාජ ඓතිහාසික වශයෙන් තොරතුරු හමු වේ.

  **නිල තුරඟුට කැඟෙමන් රිවි දෙව් සිරින**
  **දුල කැරැ සේසත් මිණි බරණ කිරණින**
  **බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන**
  **බල සේනානායක සපු කුමරු එන**

- අතීතයෙහි රටෙහි තරුණ පිරිස් නිතර සරල සැහැල්ලු කෙළිකවටකමින් යුතු විනෝදකාමී ජීවිත ගත කළ හ. ආර්ථික වශයෙන් රටෙහි ඉතා උසස් පසුබිමක් පැවති බව එයින් පැහැදිලි වේ. වී වගාව තුළින් රට සශ්‍රික තත්ත්වයක පැවති බව ද, රන්වන් කරල් ගෙන එන ගිරවුන්ගෙන් පැහැදිලි වේ. එයින් රටෙහි අතීතයේ පැවති කෘෂිකාර්මික ආර්ථිකය ගැන ද තතු පැවසේ.

  **ස න් න න් සිහින් ගෙදි සෙවණ ලු වැලි තෙලෙන**
  **තැ න් තැ න් වලම සැතපී සියුමැලි බැවින**
  **ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අතින**
  **ය න් ම න් තොසින් මග තොරතුරු නියම දැන**

- ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ සැළලිහිණි සන්දේශ කවියා රමණීය වන වැනුමක් සහෘදයා වෙතට ගෙන අයුරු සහ ඉපැරණි සමාජයක සමාජ ආර්ථික තොරතුරු මග පද්‍ය කොටසින් ඉදිරිපත් කර ඇති ආකාරයයි.

04. දියමන්ති මාලය - විචාර පිළිතුර

**කෙටිකතාව නම් සාහිත්‍ය අංගය ලොවපුරා ප්‍රකට කිරීමෙහිලා මහඟු දායකත්වයක් දක්වන ලද ප්‍රබල නිර්මාණකරුවකු වූ ගී ද මෝපසාංගේ දියමන්ති මාලය කෙටි කතාව විශිෂ්ට නිර්මාණයකි. මැටිල්ඩා හෙවත් ලොයිසල් මහත්මියගේ කේන්ද්‍රිය චරිතය වටා ගෙතී ඇති මෙම කෙටිකතාව අතෘප්තිකර කාන්තා චරිතයකට අවසානයෙහි අත්විඳීමට සිදුවන ඛේදවාචකයක් නිරූපණය කරයි. ණයට ඉල්ලා ගත් බොරු දියමන්ති මාලයක් නැතිවීම හා ඒ වෙනුවෙන් දරාගත නොහැකි මිලකට සැබෑ දියමන්ති මාලයක් මිලදී ගැනීමෙන් මුළු ජීවිත කාලයෙන් ම වන්දි ගෙවීමේ අවාසනාවන්ත සිදුවීමක් මේ සඳහා පාදක වී ඇත. බලාපොරොත්තු බිඳී යාමෙන් සදාකාලික මනස්තාපයට පත්වීමත් ලද දෙයින් සතුටට පත් නොවීමත් මිනිස් ජීවිතය කොතරම් විනාශයට ඇද දමන්නේ ද යන්නත් මේ කෙටි කතාවෙන් නිරූපිත ය.**

(අ) - ලද දෙයින් සෑහීමකට පත් නොවූ, සරල, චාම් ගති පැවතුම් ප්‍රතික්ෂේප කළ මැටිල්ඩා අවසානයේ දී මුහුණ පානු ලබන්නේ විනාශකාරී තත්ත්වයකට ය. නැති වූ දියමන්ති මාලය වෙනුවට ඊට සමාන අලුත් දියමන්ති මාලයක් මිලදී ගැනීමට සිදුවීමෙන් ලොයිසල් මහත්මා ඉසිලිය නොහැකි ණය තුරුස්වලට ගොදුරු විය. මේ අනපේක්ෂිත ණය ගනුදෙනු හේතුවෙන් ඔවුන්ට සිය ජීවිතය ම උකසට තබන්නට සිදු විය.

> **"මේ සඳහා ප්‍රොමිසරි නෝට්ටුවලට අත්සන් තැබූ ඔහු විනාශකාරී ගිවිසුම්වලට මැදිහත් විය. අධික ලෙස පොලී අය කරන්නන් හා මුදල් ණයට දෙන්නන් සමග බැඳුම්වලට එලැඹුණේ ය. එහු තමාගේ මුළු අනාගතය ම උකස් කළේ ය."**

- අලුත් දියමන්ති මාලය මිල දී ගැනීමට සිදු වූ ණයතුරුස් හේතුවෙන් ලොයිසල් මහත්මාගේ හා මැටිල්ඩාගේ ජීවිත විශාල වෙනස්කම් රාශියකට පරිවර්තනය විය. මුල සිට ම මැටිල්ඩා ප්‍රතික්ෂේප කළ මධ්‍යම පාන්තික ජීවිතයේ සැප සම්පත් ඇට සඳහටම අහිමිව ගියේ ය. මෙකී ණය තුරුස් හේතුවෙන් නිවසත්, සේවිකාවත් අහිමි වන මැටිල්ඩාට සිය මනෝලෝකවලට සමු දීමට සිදු වූවා ය.

> **"මේ භයංකර ණය තුරුස් සියල්ල ම ගෙවා අවසන් කළ යුතු වූයේ ය. ඈ සියල්ල ම විඳ දරා ගනු ඇත. සේවිකාව අස්කර දමනු ලැබූ අතර, නිවස ද වෙනස් කරන ලද්දේ ය."**

www.sinhalaguru.lk

(ආ)ii තමාගේ රූප සම්පත්තිය නිසා උසස් ධනවත් අයෙකු හා විවාහ වීමෙන් ධනවත් වීමට මැටිල්ඩා සිතා සිටියා ය. ලොයිසල් මහතා සමග විවාහ වූ දා සිට ඇයට හිමි වූ මධ්‍යම පන්තියේ නිවස, ගෘහ භාණ්ඩ, සේවිකාව හා ආහාර පාන ආදිය පිළිබඳව ඇ අතෘප්තිකර වූවා ය. ඇ එතැන් සිට ජීවත් වූයේ තමාට උරුම වූ මධ්‍යම පන්තියේ සැප සම්පත් පිළිබඳ පසුතැවීමෙන් හා සිත්තැවුලෙන් ය.

**"නිවසේ දිළිඳු අසරණකමින්, එහි බිත්තිවල කාලකන්නි දුක්ඛඃ පෙනුමෙන්. දිරා ගිය පුටු වලින් හා අවලස්සන දොර ජනෙල් රෙදිවලින් බලවත් සේ සිත් තැවුලට පත් ඇ මනස්ථාපයෙනුත් පශ්චත්තාපයෙනුත් කාලය ගත කළා ය."**

ii මදියමන්ති මාලය නැතිවීමට පෙර මැටිල්ඩා ගත කළ ජීවිතයේ තිබුණේ අපේක්ෂා භංගත්වයට පත් දුක්බරතාවයකි. ධනවත් හා සැපවත් ඉහළ ජීවිතාශාවන් බිඳී ගිය පසු ඇ ගතින් මධ්‍යම පන්තියේ ගෘහයක වුවත්, සිතින් ජීවත් වූයේ මවාගත් සිහින ලෝකවල ය. කිසිදා සැබෑ කර ගත නොහැකි එකී මායා ලෝකවල දිවි ගෙවූ ඇයට සැබෑ මධ්‍යම පන්තියේ ජීවිතය හා ඊට අයත් සැප සම්පත් මඟහැරී ගියා ය.

**"සිතින් ආශ්‍රය කිරීමට ආශාවෙන් සිටින වීර ප්‍රසිද්ධ මිනිසුන්ගෙන් සෑදුණු ඉතා විශ්වාසී මිතුරන් ස්වල්ප දෙනෙකුගේ ප්‍රිය සමාගමය සඳහා ම වෙන් කරන ලද සුගන්ධවත් සුන්දර ආහාර ද, සිතින් මවා ගත් ඇ ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝ ලෝකයක ජීවත් වූවා ය."**

ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ කෙනෙකු ජීවතයේ තමා ලද දෙයින් සෑහීමකට පත් නොවේ නම් එයින් ජීවිතය විනාශ වී යන ආකාරය හා සිහින ලෝකවල ජීවත්වීමට යාමෙන් සැබෑ ලෝකයේ ජීවිතය අහිමි වි යන ආකාරයත් ය.

**මුනිසිරිපා සිඹිමින්නේ - විචාර පිළිතුර**

**කොළඹ යුගයේ මුල් පෙළ කවියෙකු වූ ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් රචිත 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය 'ජාතික තොටිල්ල' පද්‍ය නිර්මාණයෙන් උපුටා ගන්නා ලද්දකි. එය මව් ඇකයේ නැළවෙන බිළිඳු දරුවකුගේ අනාගත යුතුකම් හා වගකීම් ඔහුට සිහිපත් කර දෙන අපූරු පද්‍ය නිර්මාණයකි. අධිරාජ්‍යවාදී ආක්‍රමණ හමුවෙහි යටත් විජිතයක්ව පැවති මෙරට සිංහලයන්ට නිදහස අහිමි වී තිබූ අවස්ථාවක ජාතික, ආගමික නිදහස ඇතිකිරීම වෙනුවෙන් දේශීය දරුවන්ට පැවරෙන වගකීම මෙම පද්‍ය පන්තියෙන් විස්තර කර තිබේ. තමා උපන් රට, ජාතිය, ආගම රැක ගැනීම හා නිදහස් කර ගැනීම මෙන් ම යහපත් ගුණධර්මවලින් යුතු දරුවකු තැනීමට අවශ්‍ය ආකල්ප ළමා මනසේ ඇතිකිරීම කවියාගේ පරමාර්ථය යි.**

(අ) තමා ඉපදුණු ජාතියට සතුරු විපතක් පැමිණි අවස්ථාවක දී ඒ විපතින් රට දැය ගළවා ගැනීමට ජාතියේ සටන් බිමට වැදී සටන් කිරීමට අවශ්‍ය තරම් වීරත්වයක් පුතුට තිබිය යුතු ය. කවියා ළමා සිතෙහි ගොඩනගා ඇත්තේ එකී වීරත්වයයි.

**ජාතික රණ දෙරණ මතේ**
**ගැටී වැටී මළ මොහොතේ**
**සුන්දර සුරඹුන්ගේ අතේ**
**නැළවෙන බව සිතනු පුතේ**

ජීවිතයට පැමිණෙන දහසකුත් එකක් කරදර බාධකවලට නොබියව නොසැලී මුහුණ දීමට පුතුට දිරිය අවැසි ය. ඒ සඳහා හොඳ වීරත්වයක් තිබීම ඉතා වැදගත් ය. කවියා ළමා සිත්හි ගොඩනගන්නේ එකී වීරත්වයයි.

**කරදර දහසක් හමු වී**
**ඉන්ටැකි නම් සිනා වෙවී**
**ඔහු මෙලොවට පහළ දෙවී**
**රජෙකැයි සලකනු මැනවී**

(ආ) සෑම දරුවෙක් ම තමා උපන් හැදී වැඩෙන දේශය දිවි දී ආරක්ෂා කළ යුතු ය. සියලු ජාතීන්ට එක්ව සමගිව සතුටින් ජීවත් වීමට අවශ්‍ය නිදහස ඇති කළ යුතු ය. එය සෑම දරුවකුගේ ම යුතුකමකි. තම රට ජාතිය වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ අගය කවියා පුතුට කියා දෙයි.

**නිදහස මහ මුහුදක් වේ**
**එහි උල්පත පුත නුඹ වේ**
**ඒ බව සිහිකොට මෙ ලොවේ**
**යුතුකම ඉටු කළ යුතු වේ**

කොතරම් නින්දා අපහාස අවමන් ජීවිතයට එල්ල වුවත් තමාගෙන් තම රටට ජාතියට ඉටුවිය යුතු යුතුකම් කොටස අනු නොකොට ඉටු කළ යුතු ය. තමා ලද ජීවිතයෙන් කොටසක් හෝ කැප කරමින් යුතුකම් ඉටු කිරීමේ අගය කියා දෙයි.

**ඉටු කොට කළ යුතු යුතුකම්**
**ලැබුණත් ලෝකෙන් ගැරහුම්**
**ඉවසන්නට පුළුවන් නම්**
**උඹයි මගේ පුතා උතුම්**

ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ එස්. මහින්ද හිමියන් ළමා සිත්හි වීරත්වය ඇති කිරීමේ හා තම රට ජාතිය උදෙසා යුතුකම් ඉටු කිරීමේ අගය කියාදීමේ අරමුණ වෙනුවෙන් ජාතික තොටිල්ල පද්‍ය පන්තිය රචනා කර ඇති බවයි.

**05. සිංහබාහු - විචාර පිළිතුර**

**දේශීය අනන්‍යතාවයෙන් යුතු සිංහල නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමියා වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ සිංහබාහු නාට්‍යය සිංහල මහාවංශයෙහි සඳහන් වන සිංහල ජාතිය බිහිවීම පිළිබඳ කතා පුවත මූලාශ්‍ර කරගෙන නිර්මාණය වූ විශිෂ්ට නිර්මාණයකි. සිංහයා හෙවත් පියා සහ සිංහබාහු හෙවත් පුතු අතර ඇතිවන ගැටුම පිය පුතු ගැටුම හෙවත් සම්ප්‍රදාය හා නූතනත්වය පිළිබඳ ගැටුම පදනම් කර ගනිමින් නාට්‍යය නිර්මාණය වී තිබේ. ලෙන අතහැර යාම හෙවත් දෙවන අංකනය තුළින් සුප්පා දේවිය සැමියා හැර දරු දෙදෙනාගේ අනාගතය වෙනුවෙන් ඔවුන් සමග වංග දේශයට යාම නිරූපණය වේ. ගොදුරු සොයා පැමිණි සිංහයා එම සිදුවීමෙන් ප්‍රකම්පනයට පත්ව වැළපෙන ආකාරය මෙම කොටසින් නිරූපණය කර තිබේ.**

- සිංහබාහු නාට්‍යයෙහි සිංහයාගේ චරිතය නාට්‍ය ගැටුමේ ප්‍රධාන චරිතයකි. වංග දේශයේ රජ කුමරිය ඔහුට ආලය කළා ය. ඔහු ඇය තම ලෙන තුළ සඟවා ගනිමින් රැකබලාගෙන පෝෂණය කළේ ය. මුළු මහත් රාජ්‍යයකින් වසන්කොට ගෙන කුමරිය රැකබලා ගනිමින් ඇයට සියලු ප්‍රත්‍ය පහසුකම් සැලසුවේ ය. සිංහයා තුළ වූ දැඩි ආලය නිසා ම අන්‍යයන්ට විවර කළ නොහැකි ගල් දොරකින් ලෙන වසා ඇයට රැකවරණය දුන්නේ ය. තමාගෙන් ඇය ලද දරු දෙපොළ ද ආදරයෙන් හා පරිස්සමින් රැකබලා ගැනීමට සිංහයා නිරතුරු ක්‍රියා කළේ ය.

- පියාගේ වෙනස්කම් දුටු සිංහබාහු සුප්පා දේවියගෙන් තතු දැනගෙන පියා නැති අතර ලෙන් දොර හැර මව හා නැගණි සමග වංග දේශයට ගොස් රජකම් කිරීමට යෝජනා කළේ ය. ඔහු කළ යෝජනාව ප්‍රතික්ෂේප කරමින් සුප්පා දේවිය පුතුට පහදා දුන් කරුණුවලින් සිංහයා කොතරම් යහපත් වගකීම් සහගත සෙනෙහෙබර පියෙක් ද යන්න සනාථ වේ. ඔහු බිරිඳ හා දරුවන් නැති බව දැන ගැනීමෙන් ළය පැලී මිය යනු ඇතැයි සුප්පා දේවිය විසින් සිදුකරන ප්‍රකාශය ඊට කදිම නිදසුනකි.

**මෙවන් දේ දොඩනු කිම**
**ඔබ පියා හැරදමා යා හැකි ද මේ ලෙනෙන්**
**අප නැතිව ඔබ පියා**
**ළය පැලී මැරී යයි**
**පුරුදු වූ වන වාසේ**
**මෙහි සැපත නොසෑහෙද**
**ඔබ පියා සමගිනා**
**මෙතෙක් කල් වින්ද මා**

- සිංහබාහු හෙවත් තම සොහොයුරා විසින් ගල්ලෙන බිඳ තම පියා ගොදුරු සොයා ගිය අතරේ තමාටත්, තම මවටත් ගල් ලෙනෙන් පිටව වංග දේශයට යාමට එන ලෙස කතා කළ අවස්ථාවේ දී සිංහ සීවලී හෙවත් නැඟණිය තම සොහොයුරාට කරුණු පැහැදිලි කර දෙන ආකාරයෙන් ද සිංහයා දරුවන් කෙරෙහි සැඟවුණු ප්‍රේමයකින් යුත් අයෙකු බව සනාථ වේ.

**මා පියා හැරදමා**
**යන්නෙ අප කෙලෙස දෝ**
**වලට ගොස් විඩා වී**
**පැමිණි විට නැත කෙනෙක්**
**අහර පිස දෙන්නටා**
**හුදෙකලා මේ ලෙනේ**
**ඉන්නෙ ඔහු කෙලෙස දෝ**

- සිංහබාහු සිය අරගලය පියාට විරුද්ධව ක්‍රියාත්මක කළ එකක් ලෙස නොව ඔහුගේ බන්ධනයෙන් ගැලවීම පිණිස සිදුකරන අරගලයක් බව කීමෙන් ඔහුට පියා කෙරෙහි කිසියම් ආදර ගෞරවයක් පැවති බව සනාථ වේ. එයින් කියැවෙන්නේ සිංහයා යහපත් පියෙකු වූ බව යි.

**පටහැණි වෙන්ටා නොව ඔහු අණටා**
**වෙන මග ගැලවෙන්ටා**
**නොපෙනෙන කලටා සැරසෙන කුමටා**
**මා දූන් වළකන්ටා**

ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ සිංහයා සැමියෙකු ලෙස ද, පියෙකු ලෙස ද තම සිතෙහි සඟවාගත් ගැඹුරු අප්‍රකාශිත ප්‍රේමයකින් බිරිඳ හා දරු දෙදෙනා ආරක්ෂා කළ බව යි.

**05. කුරක්කන් කවි - විචාර පිළිතුර**

**ජනකවි සාහිත්‍ය නියෝජනය කරන කාව්‍ය විශේෂයක් ලෙස කුරක්කන් කවි හඳුන්වාදිය හැකි ය. ගොවියන් විසින් යළ මහ දෙකන්නයේ ගොඩ භෝග වගාවක් ලෙස කුරක්කන් හේන් වගා කිරීම අතීතයේ සිට පැවත එන්නකි. කුරක්කන් ධාන්‍ය අඹරා සාදා ගත් පිටිවලින් සකසණු ලබන පිට්ටු, තලප, රොටී, කැඳ, හැලප වැනි ආහාර ඔවුන්ගේ ප්‍රධාන ආහාර වේල් බවට පත්ව තිබුණි. එබැවින් කුරක්කන් වගාවට සෙසු වගාවන්ට වඩා ප්‍රමුඛතාවයක් හිමිවිය. ඒ හා සම්බන්ධව විඳීමට සිදුවන නොයෙක් දුෂ්කරතා, අභියෝග ජයගන්නා ආකාරය ද කුරක්කන් වගාව හා බැඳී ඇති ජන විශ්වාසයන් ද ජනකවියා සතු අව්‍යාජත්වය ද මෙම පද්‍ය නිර්මාණයෙන් දැකගත හැකි ය. හේන් වගාව හා බැඳුණු බොහෝ සමාජ ජීවන තොරතුරු මෙකී පද්‍ය විශේෂය තුළින් දැකගත හැකිවීම ද විශේෂත්වයකි.**

- කුරක්කන් කවිය ජන කවි විශේෂයකි. සාමාන්‍ය ගැමි ජන ජීවිතය ඇසුරින් උපන් ජන කවිය ගැමි ජනයාගේ සිතුම් පැතුම් මෙන් ම ඔවුන්ගේ ජන ජීවිතය හා සම්බන්ධ තවත් බොහෝ තොරතුරු විස්තර කෙරෙන සාහිත්‍යාංගයකි. කුරක්කන් හේන හා ඒ ආශ්‍රිතව ගැමි ජනයා තුළ පැවති ගැමි ජන විශ්වාසයන් රැසක් ද කුරක්කන් කවිය තුළින් ප්‍රකාශ වේ. කුරක්කන් වගාවේ දී මෙන් ම අනෙකුත් වගා කටයුතුවල දී සුදුසු නැකත් වේලාවන් පිළිබඳව ගොවියන් තුළ නොයෙක් විශ්වාසයන් පැවතුණි. හේනක් සඳහා කැලය කැපීම, වල් ගිනි තැබීම හා බිම් සැකසීම මෙන්ම ධාන්‍ය වැපිරීම (ඉසීම) සිදු වන්නේ ද කිසියම් සුබ නැකතකට හෝ සුදුසු දිනයකට අනුව වීම විශේෂත්වයකි. දුරුතු මාසය කැලෑ හෙළි පෙහෙළි කිරීමට සුදුසු කාලය සේ සලකන ගැමියෝ මැදින් හෙවත් මාර්තු මාසය හෙළි පෙහෙලි කරන ලද කැලෑ ගිනි තැබීමට සුදුසු කාලය බව පිළිගනිති. ඒවාට ද සුබ වේලාවක් යොදාගනී. තවද කුරක්කන් වැනි ධාන්‍ය වැපිරීමේ දී අදාළ මාසයේ අඳුරු පොහෝ දිනක් (අමාවක) තෝරා ගන්නේ කෘමි සතුන් ආදීන්ගෙන් ඒවාට සිදුවන හානිය වළක්වා ගැනීමේ අදහසින් ය. එවැනි විශ්වාසයන් කුරක්කන් හේන හා සම්බන්ධව පැවති බවට කුරක්කන් කවියෙන් තොරතුරු හමුවේ.

**දුරුතු මහේ දී කැලයට** වැදිලා
**මසක් පමණ කල් කැලවල්** කොටලා
**මැදින් දිනේ දී වල් ගිනි** තබලා
**කුරහන් ඉසිමුව කළුවර** බලාලා

- වගා කටයුතුවල දී වගාකරුගේ අත්ගුණය පිළිබඳ පවතින විශ්වාසය ද ජන සමාජවල පැවති තවත් විශ්වාසයකි. එය තීරණය කරනු ලබන්නේ වගා කරන ප්‍රමාණය හා එයින් ලබන අස්වැන්නේ ප්‍රමාණය අනුව ය. වපුරන හෝ සිටුවන ලද ප්‍රමාණයට අපේක්ෂා කළ හැකි අස්වැන්නක් නොලැබීම වගාකරුවාගේ නිසරු බව තීරණය කරයි. අනපේක්ෂිත සරු අස්වැන්නක් ලැබීම වගාකරුගේ සරුසාර අත්ගුණය යැයි පිළිගැනේ. එවැනි හොඳ අත්ගුණයක් ඇති අයෙකුට ආවාහ විවාහ කටයුතුවල දී පවා අමතර වාසි හිමි වේ. විශේෂයෙන් නෑනා මස්සිනා විවාහය තීන්දු කිරීම පවා ඒ අනුව සිදුවී ඇත. කුරක්කන් කවිවල පහත පද්‍ය ඊට නිදසුන් සපයයි.

**කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ**
**කපන්ටත් බැරුව අතපය රුදාවේ**
**අරින්ටත් බැරුව ලොවගම සිනාවේ**
**කපමු නෑනේ ඉපනැල්ලේ සුබාවේ**

- වගාවක් සතා සිවුපාවන්ගෙන් ආරක්ෂා කර ගැනීම මෙන් ම වගාවේ අදක්ෂ අලස ගෙවියන්ගේ නෙත ගැටීමෙන් (දෘෂ්ටියෙන්) පරිස්සම් කර ගැනීමට ද වගාකරුවෝ වෙහෙස මහන්සි වෙති. හේනක් දකීමට නුසුදුසු ඇස්වහ කටවහ කාරයින් ගැමියන් විසින් හඳුනාගෙන ඇත. එවැන්නෙකුගේ ඇස්වහක් හෝ කටවහක් ඇතිවීමෙන් අස්වැන්න නිසරු වීමට ද සම්පූර්ණ වගා පාළුවකට ද ඉඩ කඩ පවතින බව විශ්වාසයයි. '**ඌරනි නොක පලයවි මගෙ කුරක්කන්...**' යනුවෙන් කවියා සඳහන් කරන්නේ එවැනි ඇස්වහ කටවහ කාරයින් විය යුතු ය. මාස් කන්නයේ වගා කළ කුරක්කන් හේනේ කුරක්කන් අස්වැන්න නිසරු වී එක් පෙති කුරක්කන් පීදී ඇත්තේ එවැන්නෙකුගේ ඇස්වහකින් හෝ කටවහකින් විය යුතු යැයි '**එපෙති වෙන්ට කවුදැයි කළ නරක්කන්**' යන පදයෙන් සනාථ වේ.

**කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්**
**වැට අහුරා ඌරන්ගේ වළක්කන්**
**කර ගන්නට බැරි උන් මග කුරක්කන්**
**ඌරනි නොකා පලයවි මගෙ කුරක්කන්**

ඉහත නිදසුන්වලින් පැහැදිලි වන්නේ කුරක්කන් වගාවේ දී ගොවියා තුළ පැවති විවිධ ගැමි ජන විශ්වාසයන් ය. විවිධ සිරිත් විරිත් හා විශ්වාසයන්හි පිහිටා ගැමියන් සිය වගා කටයුතු සිදුකළ ආකාරය මෙයින් ප්‍රකට වේ.

**06.** සිංහබාහු - විචාර පිළිතුර

**කෝට්ටේ සාහිත්‍ය යුගයේ ලියැවුණු ගුත්තිල කාව්‍ය, ජාතක කතා කාව්‍ය සාහිත්‍යය නියෝජනය කරන්නකි. සලාවත ජයපාල මැතිඳුන්ගේ ආරාධනාවෙන් රචනා වූ කෘතිය වෑත්තෑවේ හිමියන්ගේ විශිෂ්ට නිර්මාණයකි. පද්‍ය 511 කින් සමන්විත මෙම කාව්‍ය කෘතිය ගුත්තිල ජාතක කතාව මූලාශ්‍රය කර ගනිමින් රචනා වූවකි. ගුරුවරයාට ද්‍රෝහී වීමේ විපාක ශිෂ්‍යයකු වශයෙන් තමන් දන්නා බව තම ගුරුවරයා වූ රාහුල හිමියන්ට දන්වීමේ අදහසින් ලියූ බව විචාරක මතය යි. ගුත්තිල ඇදුරුතුමා හා මූසිල අතර බරණැස් රජුගේ රාජ සභාවේ වීණා වාදන තරගය පැවතුණි. එයින් මූසිල අන්ත පරාජයකට පත්ව ඇදුරුතුමා ජයග්‍රහණය කළ ආකාරය ගුත්තිල කාව්‍යයෙහි දක්වේ. 'ගුත්තිල වෙණ නද' පද්‍ය කොටසෙහි ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වාදනයෙහි මධුර බව නිරූපණය කර තිබේ. වීණා වාදනය හේතුවෙන් පරිසරයේ ඇතිවූ චමත්කාරය ද පද්‍ය කොටසින් විස්තර වේ.**

- පද්‍ය නිර්මාණ කරුවන් විසින් ස්වකීය පද්‍ය නිර්මාණ බිහි කිරීමේ දී ඒ සඳහා උචිත අපූර්ව කවි කල්පිත භාවිත කරගනු ලබයි. එවැනි කාව්‍ය සංකල්පනාවන් නිසා පද්‍යයට අලංකාරය ද, කාව්‍ය රසය ද නොඅඩුව එකතු වේ. ගුත්තිල කාව්‍ය කළ වෑත්තෑවේ හිමියන් එබඳු අපූර්ව කවි සංකල්පනා ගුත්තිල වෙණ නද පද්‍ය නිර්මාණයේ දී එකතු කරගත් කවියෙකි.

- නාගයින් හා ගුරුළු පක්ෂීන් ජන්මාන්තර වෛරක්කාරයින් සේ සැලකේ. නාගයකු දුටු සැණින් ගුරුළු පක්ෂියා ඌ ඩැහැගෙන යන්නේ ය. එහෙත් ගුත්තිල ඇදුරුතුමාගේ වීණාවේ මධුර බව හමුවෙහි ඔවුන් සිය වෛර සිත අමතක කර දමා එහි මිහිර විඳි අයුරු කදිම කවි කල්පිතයකි. ජන්මාන්තර සතුරන් සුහද මිතුරන් කිරීමෙහි සමත් ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදයෙහි සුමධුර බව එයින් කියැවේ.

අසන රිසින් නයි කැල ඔසළෝ යා
ඔවුන් වෙතම සිටිනා ගුරුළෝ යා
වයන එ වෙණ නද ලොබම කළෝ යා
එදින වෛර සිත සිහි නො කළෝ යා

www.sinhalaguru.lk

- රජුගේ රැකවලට යොදා සිටින රැකවළුන් දක්ෂ සෙබළුන්ය. ඔවුන් කොතරම් එඩිතර ද? එහෙත් එතරම් දැඩි සිත් ඇති රජුගේ සෙබළුන් පවා වීණා නාදයට වශීකෘත වූයෙන් සිය අතෙහි වූ අවි ඔවුන්ට නොදැනිම බිම වැටුණු බවට ගොඩනගා ඇති කවි කල්පිතය කොතරම් උසස් වූ එකක් ද? සෙබළුන්ගේ දැඩි සිත් මෘදු කිරීමට තරම් ගුත්තිල ඇදුරුතුමන්ගේ වීණා නාදය කොතරම් මිහිරි එකක් දැයි එයින් පැහැදිලි වේ.

**නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ**
**රැති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ**
**පැති රෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ**
**අති නවි ගිලිහෙන බව නොම දත්තෝ**

- ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වාදනය නිසා පරිසරයේ ඇති වූ අසිරිමත් බව පැවසීම සඳහා වෑත්තෑවේ හිමියන් භාවිත කළ කාව්‍ය සංකල්පනා ඉතාමත් ප්‍රබල හා සෞන්දර්යාත්මක ඒවා ය. මද කිපුණු දරුණු ඇත්තු බිත්තියෙහි අඳින ලද සිතුවමක් මෙන් කන්තල නොසොල්වා සිටිති. අශ්වයින් සිටිතැන්වල ම ගල්ගැසී සිටියේ පිළිම රැසක් ලෙසට ය. අහසේ පියාසර නොකර සංචාර නවතා සිටි කුරුල්ලන් දෙවියන්ට පණවන ලද ආසන රැසක් මෙනි. මේ සියලු කාව්‍ය සංකල්පනා කාව්‍ය රසය කුළුගන්වයි.

**වර වෙණ නද අසමින් සිත සතොසිනි**
**සර හැර සියොතුන් පියපත් විදමිනි**
**පුර ඹර වසමින් සිටි රඟ කුම් වැනි**
**සුර සෙනඟට සුරසුන් පැනවූ වැනි**

ඉහත නිදසුන් පද්‍යවලින් පැහැදිලි වන්නේ ගුත්තිල කාව්‍ය රචනා කළ වෑත්තෑවේ හිමියන් අපූර්ව කවි සංකල්පනාවලින් පද්‍ය නිර්මාණය රසවත් කර ඇති ආකාරයයි.

www.sinhalaguru.lk